# වයඹ පලාත් පාලන දෙපාර්තමේන්තුව

# වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව

**2022 වර්ෂයේ /58 වන සභා වාරයේ මහා සභා රැස්වීම් වාර්තාව -කෙටුම්පතකි**

## 2022-12-08

## පැමිණීම

1. ගරු සභාපති කේ.වී.සුසන්ත පෙරේරා මහතා
2. ගරු උපසභාපති ආර්.ඒ.නිලංක සඳකැල් මහතා
3. ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා
4. ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා
5. ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා
6. ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතා
7. ගරු මන්ත්‍රිනී ආර්.නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය
8. ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා
9. ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා
10. ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා
11. ගරු මන්ත්‍රී ඩබ්.ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතා
12. ගරු මන්ත්‍රී ඒ.රෙක්ෂි ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
13. ගරු මන්ත්‍රී කේ.එල්.චමින්ද කුමාර කරුණානායක මහතා
14. ගරු මන්ත්‍රිනී ජී.ලීනා ප්‍රියංගිකා පෙරේරා මහත්මිය
15. ගරු මන්ත්‍රිනී ජේ.කේ.දීපා මේරි අයිරංගනී පෙරේරා මහත්මිය
16. ගරු මන්ත්‍රිනී අයි.එච්.නයෝමි රම්‍යලතා මහත්මිය
17. ගරු මන්ත්‍රී ඩබ්.ඒ.රෙන්ෆ්‍රිඩ් ෂවීන් ප්‍රනාන්දු මහතා
18. ගරු මන්ත්‍රී ආර්.පී.අකිල ශිරංග රාජපක්ෂ මහතා
19. ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා
20. ගරු මන්ත්‍රී ඩබ්.ස්ටැන්ලි තිසේරා මහතා
21. ගරු මන්ත්‍රී එච්.ඒ.ක්ලීටස් පෝල් පෙරේරා මහතා
22. ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා
23. ගරු මන්ත්‍රී එල්. සුසන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු මහතා
24. ගරු මන්ත්‍රී ඩී.නිමල් අරුණ ශාන්ති විජේතුංග මහතා
25. ගරු මන්ත්‍රී බී.ඒ.එස්.ශාන්ත පෙරේරා මහතා
26. ගරු මන්ත්‍රී ඩබ්.සුරේන් ඇන්ටන් ශ්‍රීනාත් ප්‍රනාන්දු මහතා

27. ගරු මන්ත්‍රිනී එච්.එම්.එස්.බී. කරුණාරත්න මෙනවිය
28. ගරු මන්ත්‍රිනී පී.එම්.ලිහිණි අනුත්තරා ප්‍රභාෂි මෙනවිය
29. ගරු මන්ත්‍රිනී එම්.එම්.මේරි.වාලට් කුරේ මහත්මිය
30. ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ගෝඨාභය වික්‍රමසිංහ මහතා
31. ගරු මන්ත්‍රිනී ඒ.එම්.චමිලා දිල්රුක්ෂිකා මහත්මිය
32. ගරු මන්ත්‍රී වී.කේ.එම්.අසන්ත කුලසේකර මහතා

මෙදින පෙ.ව.10.00ට මහා සභා රැස්වීමේ කටයුතු ගරු සභාපති කේ.වී.සුසන්ත පෙරේරා මහතාගේ ප්‍රධානත්වයෙන් වෙන්නප්පුව ප්‍රාදේශීය සභා මහා සභා රැස්වීම් ශාලාවේදී ආරම්භ විය.

ආගම සිහිකිරීමෙන් අනතුරුව මහා සභා රැස්වීම සඳහා සහභාගී වී සිටින ගරු උපසභාපතිතුමා ඇතුළු සියළුම ගරු මන්ත්‍රීතුමන්/තුමියන් හා සහභාගී වී සිටින ලේකම්මහතා හා එම නිලධාරීන් ඇතුළු සියළු දෙනාම මහා සභා රැස්වීම සඳහා ගරු සභාපතිතුමා විසින් පිළිගන්නා ලදී.

## 01. 2022-11-10 වන දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව සම්මත කිරීම.

| |
|---|
| තීරණ අංක 01<br><br>2022-11-10 වන දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ හා ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය. |

- ❖ ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව මෙම වාර්තාවේ හතර වන පිටුවේ "වැඩ අධිකාරී මහතාගේ වාර්තාව පදනම් කරගෙන කතා කල යුතු බව ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී. මෙහිදී ගැටළුවක් මතු වූ බවත්, මේ පිළිබඳව සම්පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස ගරු මන්ත්‍රීනී එච්.එම්.එස්.බී. කරුණාරත්න මෙනවිය ප්‍රකාශ කරන ලදී.එය ලබා දී තිබෙන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. " ලෙස තිබෙන බවත් එම වාර්තාව ලබා දී තිබේදැයි විමසා සිටින ලදී.

වැඩ අධිකාරී මහතාගේ වාර්තාව ලබා දී තිබෙන බවත්, එය සභාගත කිරීමට කටයුතු කරන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

- ❖ දංකොටුව වෙලඳ සංකීර්ණයේ ගැටළුව පිළිබඳව ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා විමසා සිටින ලදී.

එතැන පාර්ශව දෙකක් සිටින බවත්,එක් පාර්ශවයක් කඩ කාමර අහිමි වූ පසුව සිදු කරනුයේ කුමක්දැයි විමසා සිටින බවත්, අනෙක් ගැටළුව නම් ප්‍රධාන ඉංජිනේරුවරුන් පැමිණ වාර්තාවක් ලබා දිය යුතු බවත් මේවා පිළිබඳව සලකා බැලිය යුතු බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

වසා තිබෙන කඩ කාමර තිබෙන බව ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

වසා තිබෙන කඩ කාමර වලට මාරු වීමට මෙම පිරිස අකමැති බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙම දෙපිරිසව ගෙන සාකච්ඡා කලේදැයි ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා විමසා සිටින ලදී.

සාකච්ඡා කල බවත්,එම කඩ විවෘත කිරීමට මිනිසුන් නොපැමිනෙන ගැටළුවක් තිබෙන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

අවශ්‍යතාවය පරිදි මෙම ස්ථානයෙන් කඩ කාමර ඉවත් කර නැවත වෙනත් ස්ථානයකින් එය ලබා දීමට මහා සභාවේ තීරණයක් ගනිමුයැයි ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

පවසන පරිදි එය පහසු නොවන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙය නීතිමනී ක්‍රමයට ටෙන්ඩර් කර ඉදි කල කඩ කාමර බවත්, සැලැස්ම පෙන්වූ පසුව මිනිසුන් ටෙන්ඩර් දමා කඩ කාමර ලබා ගත් බවත්, මෙහිදී තමන්ව ඉවත් කිරීමට තිබෙන අයිතිය පිළිබඳව පළමුව ඔවුන් විමසන බවත් ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

එම කඩ විවෘත කල යුතු බවත්, ඉවත් කරන කඩ කාමර වලට නැවත කඩ කාමර ලබා දිය යුතු බවත් ඒවා ගලපා ගන්නා ක්‍රමවේදය පිළිබඳව තමන්ට සිතා ගත නොහැකිව සිටින බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. එසේ නම් එලවළු කඩ තිබෙන ස්ථානයේ එම වෙලඳුන්ව වෙනත් ස්ථානයකට මාරු කර එතැනින් කඩ කාමර ඉදි කර ලබා දිය යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

සාකච්ඡාවකට කැඳවූයේනම් හොඳ බව ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.

එය සාර්ථක නොවන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.වෙන්නප්පුව නගරයේ කඩ කාමර දෙකක් එපායැයි පවසා එය සභාවට ගන්නා ලෙසට ලිපියක් ඉදිරිපත් කර ඇති බවත්, එම පුද්ගලයා වසර 12ක පමණ සිට බදු ගෙවන බවත් ප්‍රකාශ කරන ලදී.

මෙම කඩ කාමර කෙදිනකවත් කිසිවෙකුට බලහත්කාරයෙන් ලබා දී නොමැති බවත්,ටෙන්ඩර් කර ස්ව කැමැත්තෙන් ලබා ගත් කඩ බවත්,නමුත් මෙම කඩ කාමරය එපා කියූ විට එතැනින් එහාට එම කඩ

කාමරය සභාවට ලබා ගැනීමට ක්‍රමවේයක් නොමැතිදැයි ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා විමසා සිටින ලදී.

එය සභාවට ලබා ගැනීමට හැකි බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

එසේ නම් එලෙස කටයුතු නොකරන්නේ මන්දැයි ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා විමසා සිටින ලදී.

සභාව මඟින් එම මිනිසුන්ට වෙළඳාම් කිරීමට වටපිටාවක් ලබා දී නොමැති නම් එසේ සිදු කරන්නේ කෙලෙස දැයිද, උසාවි ගියහොත් අපට ලබා දීමට උත්තරයක් නොමැති වන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

එම පුද්ගලයා විසින්ම එම කඩ කාමරය එපා කියන්නේ නම් ගැටළුවක් නොමැති බව ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.තමන් කතා කරනුයේ පොදුවේ සභාව සතු කඩ කාමර පිළිබඳව බවත් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

වෙන්නප්පුවේ පාර අයිනේ ඉහළ මහලේ කඩ කාමර දෙකක් තිබෙන බවත්, ත්‍රීපේස් විදුලි වයර් එකක් එතැනින් යන බවත්,වවුලන් ද එතැන සිටින බවත් එබැවින් එහි වෙළඳාම් කිරීමට නොහැකි බවත් අදාල පුද්ගලයා පවසන බවත්,නමුත් ඔහු වසර 12ක පමණ සිට සභාවට එහි බදු මුදල් ගෙවන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

එම ගැටළු වලට නම් සිදු කිරීමට ඕනෑ තරම් විසඳුම් තිබෙන බවත්, වවුලන්ව එලවීමටවත් ඔවුන්ට නොහැකි දැයිද ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

එය බදු දීමට යාමේදී කිසිවෙකු නොපැමිණෙන බව ඔහු පවසන බවත්,එම පුද්ගලයාගේ ලිපිය තමන් ලේකම් මහතාට යොමු කල බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

- ගරු සභාපතිතුමාගේ හා ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනා ස්ථීරත්වයෙන් මහා සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත් කර ලේකම් මහතාට මේ පිළිබඳව සභාව දැනුවත් කිරීම සඳහා අවස්ථාව සලසා දෙන ලදී.

ලේකම් මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළු දෙනාගෙන්ම අවසර ගැනීමෙන් පසුව දන්කොටුව කඩ කාමර සම්බන්ධයෙන් ගැටළුව මතු වි වරින් වර සාකච්ඡා පවත්වා එම ගැටළුව නිරාකරණය කිරීමට කෙතරම් උත්සාහ කලද එය අවසන් කර ගැනීමට නොහැකි වී ඇති බවත්,එ්වා කීමනී යටතේ ලබා දී ඇති කඩ කාමර බවත්, ඒ යටතේ කඩ කාමර ලබා ගත් පිරිස සමඟ මෙ වන තෙක් එකඟතාවයකට පැමිණීමට නොහැකි වූ බවත් ප්‍රකාශ කරන ලදී.මාස දෙකකට පමණ පෙරද දන්කොටුවටම ගොස් එතැන සිටින කීපදෙනෙකු සම්බන්ධ කරගෙන ගරු සභාපතිතුමා සාකච්ඡා කල බවත් නමුත් පොදු එකඟතාවයකට ඔවුන් නොපැමිණෙන බවත් ප්‍රකාශ කරන ලදී. මේ පිලිබඳව කොමසාරිස්තුමා සමගද සාකච්ඡා කල බවත් ඒ සඳහා එතැන කඩ සංගමයේ සභාපති හෝ නිලධාරියෙකුද සහභාගී වූ බවත් ,කීමනී යටතේ ගිවිසුමක් සමඟ ලබා දී ඇති කඩ කාමර වලට සභාවට බලහත්කාරයෙන් කිසිවක් කිරීමට නොහැකි බවත්,මේ සඳහා සාකච්ඡාමය විසඳුමක් ලබා ගත යුතු බවත් එහිදී සාකච්ඡා වූ බව තවදුරටත් ප්‍රකාශ කරන ලදී.මෙය සභාව ඇතුළත කතා කර තීන්දු තීරණ ලබා ගත නොහැකි බවත්,මේ සඳහා කමිටුවක් පත් කර ගන්නා ලෙසට කොමසාරිස්තුමාද උපදෙස් ලබා දුන් බවත්, මන්ත්‍රීවරුන් හා නිලධාරීන්ගෙන් සැදුම්ලත් කමිටුවක් සකස් කර එහි සිටින වෙලඳ සංගමයේ පිරිසවත් ගෙන්වා සාකච්ඡා කර විසඳුමක් ලබා ගනිමුයැයිද,ඉන් පසුව එම වාර්තාව කමිටුව මඟින් ගරු මහා සභාවට ඉදිරිපත් කර තීන්දුවක් ගනිමුයැයිද තවදුරටත් ප්‍රකාශ කරන ලදී.සභාව මඟින් කමිටු සාමාජිකයින් පත් කර ලබාදෙන ලෙසටද ඉල්ලා සිටින ලදී.

මෙම කඩ කාමර ලබා ගත් පිරිසට කීමනී ගිවිසුමක් තිබෙන්නේදැයිද,නීත්‍යානුකූලව මෙම පිරිස මේ දක්වා බදු ගෙවාගෙන යන්නේදැයිද ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා විමසා සිටින ලදී.

නොගෙවන පිරිසක්ද සිටින බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙම කඩ කාමර වලට අදාල කීමනී ගිවිසුම් සභාව සතුව තිබෙන්නේදැයිද ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා විමසා සිටින ලදී.

සියළුම කඩ කාමර සඳහා ගිවිසුම් නොමැති බවත් ලේකම් මහතා ප්‍රකාශ කරන ලදී.

එසේ නම් නිත්‍යානුකූලයැයිද ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා විමසා සිටින ලදී. එම මිනිසුන් සතුවද ගිවිසුම් තිබේදැයි තවදුරටත් විමසා සිටින ලදී.

යම් අය ඔවුන් සතුව තිබෙන බව පවසන බවත්,ඒවා ඉදිරිපත් කරන ලෙසට පැවසූ බවත් ලේකම් මහතා ප්‍රකාශ කරන ලදී.

කමිටුවට ඔවුන් ගෙන්වූ විට එකම එක පුද්ගලයෙකු පමණක් ගිවිසුම ගෙනා බවත්, වෙනත් කිසිවෙකු නොගෙනා බවත්,වැඩි පිරිසක් ඉතාලියේ සිටින බවත් එදා මෙදා තුර එම කඩ කාමර විවෘත කර නොමැති බවත් බදු ගෙවා නොමැති බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.සභාවේ අත්‍යවශ්‍ය කටයුත්තක් මත මෙම කඩ කාමර ඉවත් කිරීම සඳහා බලයක් නොමැතිදැයිද විමසා සිටින ලදී.

ට්‍රාන්ස්ෆෝමරය සඳහා 2011දී අත්සන් කල බවත්,එම රිසිට් පත් තිබෙන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

එදා සිට අද වන තෙක් බදු ගෙවා ඇත්නම් එවා ආපසු ගෙවා සභාවේ අත්‍යවශ්‍ය කටයුත්තකට ඒවා පවරා ගැනීමට අයිතියක් නොමැති දැයි ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා විමසා සිටින ලදී.

කඩ කාමර පවත්වාගෙන නොයන්නේ නම් සභාවට පවරා ගැනීමට හැකියාවක් තිබෙන බවත්,නමුත් ප්‍රායෝගික ගැටළු තිබෙන බවත් ලේකම් මහතා ප්‍රකාශ කරන ලදී.පසුගිය දිනක එම කඩ කාමර කඩා ඉවත් කිරීමට මෙම සභාවේදීම තීරණය කල බවත් නමුත් එදිනම එසේ සිදු නොකිරීමට නැවත තීරණය කල බවත් ප්‍රකාශ කරන ලදී.එබැවින් මේ පිලිබඳව කොමසාරිස්තුමා සමඟද සාකච්ඡා කල බවත්,කමිටුවක් මඟින් මෙහි තිබෙන සත්‍ය තත්ත්වයද බලා ඒවා සියල්ල සමඟම වාර්තාවක් ඉදිරිපත් කලේ නම් එවිට පැහැදිලි තීරනයක් ගැනීමට හැකි වන බවත් ප්‍රකාශ කරන ලදී.

මෙතරම් කාලයක් සාකච්ඡා තබා තිබෙන බවත්.ඒවායෙහි සියළුම වාර්තා සභාගත කරන ලෙසත් ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.

අවසානයේදී තිබූ සාකච්ඡාවේදී සියළුම දෙනා නොපැමිණි බවත්, කීපදෙනෙකු පමණක් පැමිණි බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

දැනුම් දී තිබියදී නොපැමිණීම ඔවුන්ගේ වරදක් බව ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.

තවත් එකක් මතක් කරන බවත්, ගෙවා නොමැති කඩයක් වෙනත් කෙනෙකුට සභාව මඟින් බදු ලබා දුන් බවත්,එවිට ඒ සඳහා එම කඩය අයිති පුද්ගලයා පැමිණි බවත්,කඩ ඇරීමට වටපිටාවක් සකස් නොකර වෙනත් කෙනෙකුට එලෙස කඩ ලබා දෙන්නේ මන්දැයි විමසූ බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. මිනිසුන් සෑම විටම ඉල්ලනුයේ වෙලදාම් කිරීමට වාතාවරණයක් සකස් කර දෙන ලෙසයැයි ද, එය සභාව මඟින් සිදු විය යුතු බවත් පවසා සිටින ලදී.

මෙය රටේ ගැටළුවක් බවත්, මේ වන විට වෙලදාම නොමැති බවත් ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා ප්‍රකාශ කරන ලදී.

එය මෑතකදී සිදු වූ බවත්,නමුත් මෙම ගැටළුව ඊට පෙර සිටම පවතින බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ඝෝෂාව.......

පිටරටවල සිටින පිරිස ව්‍යාපාර කරන බව පෙන්වීම සඳහා කඩ බදුගෙන ඇති බව ගරු මන්ත්‍රී ඒ.රෙක්ෂි ප්‍රභාත් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

ලුණුවිල කඩ කාමර වල කිසිඳු ගෙවීමක් පැහැර හැර නොමැති බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

නමුත් ඒවා වසා ඇති බව ගරු මන්ත්‍රී ඒ.රෙක්ෂි ප්‍රභාත් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

ඝෝෂාව.......

එදා කමිටුවේදී කඩ කාමර විවෘත නොකලේ නම් නැවත සභාවට පවරා ගැනීම සඳහා තීරණයක් ගත් බව ගරු මන්ත්‍රිනී ජේ.කේ.දීපා මේරි අයිරංගනී පෙරේරා මහත්මිය ප්‍රකාශ කරන ලදී.

කඩය බදු ගෙන තුන් මාසයක් ඇතුළත එය විවෘත නොකලහොත් නැවත සභාවට පවරා ගන්නා ලෙසට පොදු පහසුකම් කමිටුවේදී සාකච්ඡා කල බවත්,ගිවිසුමට ඇතුල් කරන ලෙසට ජයසූරිය මහතාට පැවසූ බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී,

ඝෝෂාව............

තමන් දන්කොටුවේ නිලධාරීන් සමඟද කතා කල බවත්, වෙළඳුන්ව පොළ ඇතුළත හිර කල විට වෙලදාම වැඩි බවත්,පසුගිය සතියේ සෑම තැනින්ම වෙලඳුන් පැමිණි බවත් එවිට සෙනඟද වැඩි වන බවත් ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා ප්‍රකාශ කරන ලදී.එලවළු මාකට් එකට වැසී ඇතිබවත්,මාළු කඩයට එලවළු කඩයට සෙනඟ පැමිණෙන්නේ නම් මෙම කඩ සඳහා සෙනඟ නොපැමිණෙන්නේ මන්දැයිද,ඒවා විවෘත කලේ නම් සෙනඟ පැමිණෙන බවත් ප්‍රකාශ කරන ලදී.කඩ වසා සෙනඟ නොපැමිණෙන බව පැවසූ විට කිරීමට දෙයක් නොමැති බවත්,බොහෝ පිරිසක් විදෙස් ගතව සිටින බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී. සැලූන්,ටේලර් ෂොප් වැනි දෑ කොහේ තිබුණත් අවශ්‍යතාවය තිබෙන පුද්ගලයා ඒවාට යන බවත්,එලළුව මාකට් එක ඉවත් කිරීමට සූදානම් බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

එක් වරක් මේ සඳහා එලවළු මාකට් එකේ පිරිස එතැනට පැමිණ කඩාකප්පල් කල බැවින් මෙම ගැටළුව විසදා ගැනීමට නොහැකි වූ බවත්,මෙම පිරිසව වෙනත් ස්ථානයකට යොමු කිරීමට හැකි නම් මෙම ගැටළුව බොහෝදුරට අවසන් වන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

එලවළු පිරිසට වරින් වරට තැනින් තැනට යාමට නොහැකි බවත්,මාළු මාකට් එකට ඉදිරියෙන් එය ඉදි කල හැකි බවත්, පොලේ කඩ කාමර අසලින් අවසන් වන බවත්, එවිට කීමනී ගෙන හෝ එම කඩ කාමර සාදන්නේ නම් කැමති බවත්,එවිට මේ සියල්ලටම විසඳුමක් ලැබෙන බවත් ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා ප්‍රකාශ කරන ලදී.

සඳුදාට පොදු පහසුකම් කමිටුවේ සාමාජිකයින්ට එම ස්ථානයට පැමිණිය හැකිදැයි ගරු සභාපතිතුමා විමසා සිටින ලදී.

කීප වතාවක්ම එම ස්ථානයට ගිය බවත්,වඳුරන් ගෙවල් සාදන ලෙස මෙහිදී තීරණ ගන්නා බවත්, එක එක්කෙනා පවසන පරිදි කටයුතු කරන බවත්,මෙම කඩ කාමරද එලෙස සාදා ඇති බවත් නැවතත් මෙම ගැටළුව විසඳීමට තවත් ඉදි කිරීමකට ගොස් එයින්ද ප්‍රයෝජනයක් නොවුනහොත් සිදුකල වියදම අපරාදයක් වන බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී,

එසේ නම් මේ සඳහා ගන්නා විසඳුම කුමක්දැයි ගරු සභාපතිතුමා විමසා සිටින ලදී.

බදු ගිවිසුම්, මුදල් ගෙවූ රිසිට්පත් සමඟ අයිතිකරුවන් ගෙන්වා සාකච්ඡා කරමුයැයිද,නමුත් අයිතිකරුවන් නොව නාමික පුද්ගලයින් පැමිණෙන බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

කඩ කාමර වල අයිිකරුවන්ට පැමිණෙන ලෙස පවසමුයැයි බොහෝ මන්ත්‍රීවරුන්ද පවසා සිටින ලදී.

ගරු සභාපතිතුමා මීන් පෙර ගැටළුවක් සම්බන්ධයෙන් පැවසූ බවත්,කඩ කාමරයක් බදු දුන් විට අයිතිකරු සභාවට පැමිණි බවත්,එසේ නම් එහි අයිතිකරු එම කඩ කාමරය විවෘත නොකරන්නේ මන්දැයිද ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ගෝඨාභය වික්‍රමසිංහ මහතා විමසා සිටින ලදී.

එම පුද්ගලයාට එම වටපිටාව සකස් කර දෙන ලෙසට පැවසන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

එලවළු මාකට් එකේ පිරිසට කඩ ලබා දුන්නේ නම් මෙම ගැළුව නොපැමිණෙන බව ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ගෝඨාභය වික්‍රමසිංහ මහතා ප්‍රකාශ කරන ලදී,

පොදු පහසුකම් කමිටුව මඟින් මෙම ගැටළුව අවසන් කර දීමට හැකිදැයි පොදු පහසුකම් කමිටුවේ ගරු සභාපති ජුඩ් එම්මානුවෙල් මහතාගෙන් ගරු සභාපතිතුමා විමසා සිටින ලදී.

සඳුදා දින ගරු සභාපතිතුමාද,ලේකම් මහතාද,කමිටු සාමාජිකයින්ද එතැනට රැස්වී අදාල තීන්දු තීරණ ගනිමුයැයි ගරු මන්ත්‍රී යූ.ජුඩ් එම්මානුවෙල් මහතා ප්‍රකාශ කරන ලදී.

එසේ නම් කමිටුව සමඟ ගරු සභාපතිතුමාද සහභාගී වන ලෙසත්,කමිටු තීරණ ගරු සභාපතිතුමා වෙනස් කරන බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

මෙම දන්කොටුවේ කඩ හිමියන්ගේ නාම ලේඛණය,කඩ කාමර පවත්වන නොපවත්වන පිරිසගේ තොරතුරු,බදු ගෙවන නොගෙවන තොරතුරු සියල්ල පලමුව වාර්තා කර ගනිමුයැයිද නැතහොත් දන්කොටුව ජයකොඩි ක්‍රීඩාංගණයේ නඩුවට ගිය ලෙස මෙයද සිදුවේයැයි ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.මේ සඳහා දේශපාලනඥයින්ට තීන්දු ගැනීමට නෛතික බලයක් තිබේදැයිද පලමුව බලන ලෙසත් මේ සියල්ලටම පසුව කමිටුව රැස්වී තීන්දු තීරණ ගනිමුයැයිද තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

එම වාර්තාව සභාව අවසන් වීමට පෙර ලබා දීමට නොහැකිදැයිද ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා විමසා සිටින ලදි.

2022-12-13 වන දින තිබෙන මුදල් කමිටුවට මෙය යොමු කරන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මේවා කැඳවන විට අයිතිකරුවම කැඳවන ලෙස ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

මෙම ගැටළුව 2023 වර්ෂය වන තෙක් තබා නොගන්නා ලෙසට ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදි.

මෙම පවසන ගැටළුව පිලිබඳව තවමත් නීති උපදෙසක් ලබාගෙන නොමැති බව ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.එසේ කටයුතු කිරීමට හැකිදැයි නොහැකිදැයි ද නොදන්නා බවත් ප්‍රකාශ කරන ලදි.

එම කඩ හිමියන් විසින් කඩ කාමර විවෘත කිරීමට හැකි වාතාවරණයක් නොමැති බව පවසා පැමිණියහොත් එයට ලබාගෙන පිලිතුර කුමක්දැයි ගැටළුවක් තිබෙන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මේ සඳහා වාර්තාවක් ඉල්ලූයේ එම නිසා බව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

අප සභාව ජනතාවගේ සුභ සිද්ධිය උදෙසා පවත්වාගෙන යන බවත්,මෙම ව්‍යාපාර තුලින් ජනතාවගේ සුභ සිද්ධිය අවශ්‍ය වන බවත්,මෙම පවසන කඩ කාමර දෙක නිසා විශාල ලෙස පාරිභෝගික ජනතාවට,අනෙක් කඩ හිමියන්ට අවහිරයක් සිදු වන්නේ නම් සභාව එය ඉවත් කිරීමට බැඳී සිටින බවත් බව ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.2009 වර්ෂයේ සිට මෙම ගැටළුව තිබෙන බවත්,කෙදිනකවත් මෙම පවසන ගැටළුව සම්බන්ධයෙන් ගිවිසුමක් හෝ ලිපි ගොණුවක් සභාවට ඉදිරිපත් කර නොමැති බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදි.ඊළඟ වාරය වන විට සභාව පවත්වන්නට හැකිවේදැයි නොදන්නා බවත්,නමුත් ඊට පෙර මෙම ලිපි ගොනුව ඉදිරිපත් කර අවශ්‍ය උපදෙස් ගෙන මේ සඳහා පියවරයක් ගනිමුයැයිද වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.දින 14ක් ඇතුළත එම කඩ කාමර විවෘත කරන ලෙසත්,නැතිනම් ඉවත් වන ලෙසටත් දැන්වීමක් කර මෙම කටයුත්ත සිදු කරමුයැයිද ප්‍රකාශ කරන ලදී.අදාල තැනට ගොස් කමිටු නොපවත්වන ලෙසත්,අදාල පිරිසව සභාවට ගෙන්වන ලෙසත් ප්‍රකාශ කරන ලදී.

## 02. ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන

### 01. නිවාඩු අනුමත කිරීම

a) මහා සභාව සඳහා නොපැමිණෙන ගරු මන්ත්‍රීවරුන්ගේ හා ගරු මන්ත්‍රීවරියන්ගේ නිවාඩු අනුමත කිරීම.

| |
|---|
| තීරණ අංක 02<br><br>මහා සභා රැස්වීමට සහභාගී වීමට නොහැකි බව දන්වා නිවාඩු අයදුම්කර ඇති පහත නම් සඳහන් |

ගරු මන්ත්‍රීවරුන්ගේ හා ගරු මන්ත්‍රීවරියන්ගේ නිවාඩු අනුමත කිරීම සඳහා ගරු සභාපතිතුමා ඉදිරිපත් කල යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දීමට තීරණය කරන ලදී.

- ගරු මන්ත්‍රී කේ.එන්.සුදත් ජානක පෙරේරා මහතා
- ගරු මන්ත්‍රී එල්.දිනේෂ් චන්දන පෙරේරා මහතා
- ගරු මන්ත්‍රී ජී.අශේන් විමුක්ති ප්‍රනාන්දු මහතා
- ගරු මන්ත්‍රී ඩබ්.දුලක්ෂි චමෝදරී ප්‍රනාන්දු මහත්මිය
- ගරු මන්ත්‍රී වී.ඒ.වර්ණ රංග ගුණසේකර මහතා
- ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා
- ගරු මන්ත්‍රී එස්.එම්.සුදත් චන්දන මහතා
- ගරු මන්ත්‍රී අයි.බී.සැම් හරීශ්නාත් සරත්චන්ද්‍ර මහතා
- ගරු මන්ත්‍රී එස්.එම්.දර්ශන දිමුතු කුමාර සුබසිංහ මහතා

b) කාරක සභා සඳහා නොපැමිණි ගරු මන්ත්‍රීවරුන්ගේ හා ගරු මන්ත්‍රීවරියන්ගේ නිවාඩු අනුමත කිරීම.

තීරණ අංක 03

2022 ඔක්තෝබර් සහ නොවැම්බර් මාස වල පැවති පහත සඳහන් කාරක සභා සඳහා සහභාගී නොවූ පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන්ගේ හා ගරු මන්ත්‍රීවරියන්ගේ නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

| | |
|---|---|
| **2022 නොවැම්බර් මස 10 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව** | |
| අ/අ | නම |
| **1.** | ගරු උපසභාපති ආර්.ඒ.නිලංක සඳකැල් මහතා |
| **2.** | ගරු මන්ත්‍රිනී නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය |
| **3.** | ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා |
| **4.** | මන්ත්‍රී ඩබ්.ශිරෝන් ගාමිණි අසෝක ප්‍රනාන්දු මහතා |
| **5.** | ගරු මන්ත්‍රිනී එච්.එම්.සුදර්ශි භාග්‍යා කරුණාරත්න මෙනවිය |
| **2022 නොවැම්බර් මස 18 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව** | |
| **අ/අ** | නම |
| **1.** | ගරු උපසභාපති ආර්.ඒ.නිලංක සඳකැල් මහතා |
| **2.** | ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා |
| **3.** | ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා |
| **4.** | ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා |
| **5.** | මන්ත්‍රී ඩබ්.ශිරෝන් ගාමිණි අසෝක ප්‍රනාන්දු මහතා |
| **2022 නොවැම්බර් මස 18 වන දින පැවති මාර්ග, ඉඩම් , ගොඩනැඟිලි හා කාර්මික සේවා කාරක සභාව** | |
| අ/අ | නම |
| **1.** | ගරු මන්ත්‍රී ඩබ්.ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතා |
| **2.** | ගරු මන්ත්‍රිනී නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය |
| **3.** | ගරු මන්ත්‍රී ඒ.රෙක්ෂි ප්‍රභාත් ප්‍රනාන්දු මහතා |
| **4.** | ගරු මන්ත්‍රී ජී.කේ.අශේන් විමුක්ති ප්‍රනාන්දු මහතා |
| **5.** | ගරු මන්ත්‍රී එල්.දිනේෂ් චන්දන පෙරේරා මහතා |
| **6.** | මන්ත්‍රී ඩබ්.ශිරෝන් ගාමිණි අසෝක ප්‍රනාන්දු මහතා |
| **7.** | ගරු මන්ත්‍රී එල්.සුසන්ත ශ්‍රිනාත් ප්‍රනාන්දු මහතා |
| **2022 ඔක්තෝබර් මස 21 වන දින පැවති පොදු පහසුකම් හා ආපදා කලමනාකරණ කාරක සභාව** | |
| **අ/අ** | නම |

| | |
|---|---|
| **1.** | ගරු මන්ත්‍රී ඩබ්.ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතා |
| **2.** | ගරු මන්ත්‍රී ආර්.පී.අකිල ශිරංග රාජපක්ෂ මහතා |
| **3.** | ගරු මන්ත්‍රී ඩබ්.ස්ටැන්ලි තිසේරා මහතා |
| **4.** | ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා |
| **5.** | ගරු මන්ත්‍රී ඩී.නිමල් අරුණ ශාන්ති විජේතුංග මහතා |
| **6.** | ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා |
| **7.** | ගරු මන්ත්‍රී එස්.එම්.දර්ශන දිමුතු කුමාර සුහසිංහ මහතා |

**2022 නොවැම්බර් මස 24 වන දින පැවති පරිසර හා සෞඛ්‍ය පහසුකම් සංවර්ධන කාරක සභාව**

| අ/අ | නම |
|---|---|
| 1 | ගරු මන්ත්‍රිනී නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය |
| 2 | ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා |
| 3 | ගරු මන්ත්‍රී කේ.එල්.චමින්ද කුමාර කරුණානායක මහතා |
| 4 | ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා |
| 5 | ගරු මන්ත්‍රී ඩබ්.ස්ටැන්ලි තිසේරා මහතා |
| 6 | ගරු මන්ත්‍රී කේ.නොඑල් සුදත් ජානක පෙරේරා මහතා |
| 7 | ගරු මන්ත්‍රී එච්.ඒ.ක්ලීටස් පෝල් පෙරේරා මහතා |
| 8 | ගරු මන්ත්‍රී ඩී.නිමල් අරුණ ශාන්ති විජේතුංග මහතා |
| 9 | ගරු මන්ත්‍රී වී.කේ.එම්.අසන්ත කුලසේකර මහතා |

**2022 නොවැම්බර් මස 29 වන දින පැවති ප්‍රජා සංවර්ධන කාරක සභාව**

| අ/අ | නම |
|---|---|
| 01 | ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා |
| 02 | ගරු මන්ත්‍රී කේ.නොඑල් සුදත් ජානක පෙරේරා මහතා |
| 03 | ගරු මන්ත්‍රී ආර්.පී.අකිල ශිරංග රාජපක්ෂ මහතා |
| 04 | ගරු මන්ත්‍රී ජී.කේ.අශේන් විමුක්ති ප්‍රනාන්දු මහතා |
| 05 | ගරු මන්ත්‍රී ඩබ්.සුරේන් ඇන්ටන් ශ්‍රීනාත් ප්‍රනාන්දු මහතා |
| 06 | ගරු මන්ත්‍රිනී ආර්.පී.නදීකා රණවීර මහත්මිය |
| 07 | ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා |

C) ගරු මන්ත්‍රිනී ආර්.පී.නදීකා රණවීර මහත්මිය විසින් මාස තුනක කාලයක් සඳහා නිවාඩු ලබා දෙන ලෙස ඉදිරිපත් කර ඇති ඉල්ලීම සලකා බලන ලද අතර පහත සඳහන් පරිදි තීරණය කරන ලදී.

තීරණ අංක 04

ගරු මන්ත්‍රිනී ආර්.පී.නදීකා රණවීර මහත්මියගේ ඉල්ලීම පරිදි මාස තුනක කාලයක් සඳහා නිවාඩු ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

D) ගරු මන්ත්‍රී ඩබ්.ශිරෝන් ගාමිණී අසෝක ප්‍රනාන්දු මහතාගේ ඉල්ලීම පරිදි මාස තුනක කාලයක් සඳහා නිවාඩු ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව සලකා බලන ලද අතර පහත සඳහන් පරිදි තීරණය කරන ලදී.

තීරණ අංක 05

ගරු මන්ත්‍රී ඩබ්.ශිරෝන් ගාමිණී අසෝක ප්‍රනාන්දු මහතාගේ ඉල්ලීම පරිදි මාස තුනක කාලයක් සඳහා

| |
|---|
| නිවාඩු ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී |

02. GIS තාක්ෂණය උපයෝගී කරගනිමින් දේපල සමීක්ෂණ කටයුතු සිදු කරන ආකාරය පිළිබඳව ප්‍රායෝගීක පුහුණු වැඩමුළුවක් 2022-11-14 වන දින පැවැත්වීමට හැකි වූ බවත් ඒ සඳහා සහයෝගය ලබා දුන් ලේකම් මහතා ඇතුළු සියළුම දෙනාට ස්තුතිය පුද කරන ලදී.

03. වෙන්නප්පුව ප්‍රදේශයේ රාජ්‍ය ආයතන හා සම්බන්ධ වෙමින් 2022-11-17 වන දින බණ්ඩිරිප්පුව ගාලවත්ත ජනපදයේ ඩෙංගු වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට හැකි වූ බවත් ඒ සඳහා සහයෝගය ලබා දුන් කොට්ඨාස භාර ගරු මන්ත්‍රී ඒ.රෙක්ෂි ප්‍රභාත් ප්‍රනාන්දු මහතා,වෛද්‍ය කාර්යමණ්ඩලයේ සියළුම දෙනා,ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සියළුම දෙනාට ස්තූතිය පුද කරන ලදී.

ඩෙංගු පිළිබඳව කතා කිරීමේදී පසුගිය දින තමන්ව මීගමුව රෝහලට කැඳවීමක් කල බවත්,එහිදී දත්ත වාර්තා සමඟ සියළුම දෙනා සාකච්ඡා කල බවත්,එම රෝහලේ ඇඳවල් පිරී ඇති බවත්, ඩෙංගු මර්ධන ඒකකයද ක්‍රියාත්මක නොවන බවත්, මේ වන විට ලෙඩුන් වැඩි වී ඇති බවත් බෙහෙත් වල අඩුපාඩුද තිබෙන බවත් ප්‍රකාශ කරන ලදී. රෝගීන් වැඩි වීමේදී වෙනත් රෝගීන්ට පහසුකම් හිඟ වී මරණ සංඛ්‍යාව ඉහළ ගොස් ඇති බවත්,හෘද රෝගීන්ට මෙය විශාල ලෙස බලපා ඇති බවත් එය දත්ත වාර්තා සමඟ වෛද්‍යවරුන් විසින් පෙන්වා දුන් බවත් ප්‍රකාශ කරන ලදී.තම නිවස අවට පිරිසිදු කර ගන්නා ලෙසත් මේ සඳහා ගාලවත්තේ ආදර්ශයක් සිදු කල බවත්,දූමා යනයට එම මදුරුවා හුරු වී ඇති බැවින් එය මේ සඳහා පිලියමක් නොවන බවත්,කියුබාවෙන්ද මේ සඳහා පිළියම් ගෙන්වීමට අධික වියදමක් යන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.තම ගෙවත්ත පිරිසිදු කිරීමට කටයුතු කරන ලෙසත් ,කසල ක්‍රමවත්ව බැහැර කර දුනහොත් තමන් එය ලබා ගන්නා බවත් එලෙස කටයුතු කර මෙම වසංගතය තුරන් කිරිමට කටයුතු කරමුයැයිද ප්‍රකාශ කරන ලදී.
කසල සතියට වරක් හෝ එකතු කලහොත් හොඳ බව ගරු මන්ත්‍රී ඒ.රෙක්ෂි ප්‍රභාත් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.
ඇත්තෙන්ම අද වන විට තෙල් ලබා ගැනීමේ අපහසුතාවය තිබෙන බවත්,QR කේතයට පමණක් ඉන්ධන නිකුත් කරන බවත්,අදත් මන්ත්‍රීවරුන්ගෙන් සහය ගෙන QR කේත ගෙන අද ඉන්ධන ලබා ගත් බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.පෙරේදා දින කොළින්ජාඩියේ සිදු වූ සිදු වීමත් සමඟ එවැනි මිනිසුන්ද සිටින බවත් ,රටේ වසංගත තත්ත්වය පිළිබඳ ප්‍රධාන මාධ්‍ය වල කතා කල යුතු බවත් ප්‍රකාශ කරන ලදී.සියළු දෙනාම එකට එකතු වී මේ පිළිබඳව කටයුතු කල යුතු බවත්,ඇළ වේලිද පිරිසිදු කල බවත්,නිවෙස් 100ක් ගත් විට නිවෙස් 20ක ඩෙංගු කීටයන් ගාලවත්තේ සිටි බවත් එබැවින් මේ පිළිබඳව ජනතාව දැනුවත් කරමුයැයිද ප්‍රකාශ කරන ලදී.
කොරෝනා රෝහලක් ලුණුවිල රෝහලේ විවෘත කල බවත්,මෙම අවස්ථාවේදී එය ඩෙංගු රෝහලක් බවට පත් කරගත නොහැකිදැයි ගරු මන්ත්‍රී බී.ඒ.එස්.ශාන්ත පෙරේරා මහතා විමසා සිටින ලදී.
මේ පිළිබඳව එම කාර්ය මණ්ඩලය හා වෛද්‍යවරුන් තීරණය කල යුතු බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.
ඉල්ලීමක් කිරීමට ගරු සභාපතිතුමාට හැකි බව ගරු මන්ත්‍රී බී.ඒ.එස්.ශාන්ත පෙරේරා මහතා ප්‍රකාශ කරන ලදී.
මහා සභාවේ ගත් තීරණයක් ලෙස මේ පිළිබඳව සෞඛ්‍ය අමාත්‍යාංශයට ඉල්ලීමක් කරමුයැයිද,මීගමුව රෝහලේ වෛද්‍යතුමාටද මෙහි පිටපතක් යවමුයැයි ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.
මේ පිළිබඳව ගම් මට්ටමින් ජනතාවගේ දැනුවත් වීමක් නොමැති බවත්,සෑම වසමකටම මේ පිළිබඳව දැනුවත් කිරිමක් යවන ලෙසත්,එවිට ජනතාවද උනන්දු වන බවත් ගරු මන්ත්‍රිනී ආර්.නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය ප්‍රකාශ කරන ලදී.

සතියට දින දෙකක් නිවේදනයක් යන ලෙසට තමන් උපදෙස් ලබා දී ඇති බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

| තීරණ අංකය 06 |
| --- |
| ලුණුවිල රෝහලේ දැනට පවතින කොරෝනා වාට්ටුව හිස්ව පවතින බැවින් එම ස්ථානය ඩෙංගු රෝගීන් සඳහා වෙන් කර පවත්වාගෙන යාම සඳහා ඉල්ලීම් ලිපියක් යවන ලෙසට ගරු මන්ත්‍රී බී.ඒ.එස්.ශාන්ත පෙරේරා මහතා විසින් ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු සභාපතිතුමා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව එම ලිපිය සෞඛ්‍ය අමාත්‍යංශය වෙත මීගමුව රෝහලටද පිටපත් සහිතව ඉදිරිපත් කිරීමට තීරණය කල අතර ඒ සඳහා ගරු මහා සභාවේ ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී. |

04. පලාත් පාලන ආයතනයක් ලෙස සම්ප්‍රදායිකව පවත්වාගෙන යන ක්‍රියා පටිපාටියෙන් බැහැරව කාලීන අවශ්‍යතාවය නිවැරදිව හඳුනා ගනිමින් නව මානයක් වෙත යොමු වෙමින් ආරම්භ කරන ලද වගා ව්‍යාපෘතියේ අස්වැන්න නෙලීම පසුගිය දින සිදු කිරීමට හැකි වූ බවත් එය මුළු පළාත් පාලනයටම ආදර්ශයක් බවද තවදුරටත් සතුටින් දැනුම් දෙන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.මේ සඳහා කැපවීම් කල සියළුම දෙනාට ස්තූතිය පුද කරන ලදී.

මේ පිළිබඳව ස්ථාන පරීක්ෂාවකට යමුයැයි ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.

05. සේවක පුහුණු විෂය ධාරාව යටතේ PL- කාණ්ඩයේ සේවක මහත්ම මහත්මීන් සඳහා 2022-11-18 වන දින දංකොටුව නගර ශාලාවේදී සේවක අභිප්‍රේරණ වැඩ සටහනක් වයඹ පලාත් පාලන දෙපාර්තමේන්තුවේ සැලසුම් අධ්‍යක්ෂ එච්.එන්.බී.අබේවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වීමට හැකි වූ බවත් ඒ සඳහා සහයෝගය ලබා දුන් ලේකම් මහතා ඇතුළු සියළුම දෙනාට ස්තූතිය පුද කරන ලදී.

මේ පිළිබඳව සතුටු බවත්,විපක්ෂයටද මේ පිළිබඳව ආරාධනා කරන ලෙසත් ,එන නොයන එක වෙනම දෙයක් බවත් නමුත් ආරාධනා කරන ලෙසත් ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.

06. වෙන්නප්පුව බල ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී පවුල් වල රෝගීන් සඳහා රෝගී ආධාර බෙදා දීම පසුගිය දින සිදු කිරීමට හැකි වූ බවත් ඒ සඳහා සහයෝගය ලබා දුන් ලේකම් මහතා, ප්‍රජා සංවර්ධන කමිටුවේ ගරු සභාපතිතුමා ඇතුළු කමිටු සාමාජිකයින් සියළුම දෙනාටද ස්තූතිය පුද කරන ලදී.

07. අද දින මහා සභා රැස්වීමෙන් පසුව මුදල් කමිටුව පැවැත්වෙන බව දැනුම් දෙන ලදී.

08. දැනට පවතින කමිටු සියල්ලම 2023 වර්ෂයේදී යාවත්කාලීන කිරීම සඳහා මෙම මහා සභාවෙන්ම තීරණයක් ගනිමුයැයි ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.සංශෝධන තිබේ නම් ඒවා ඉදිරිපත් කරන ලෙසත් දැනුම් දෙන ලදී.

| තීරණ අංකය 07 |
| --- |
| වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ දැනට පවතින කමිටු සියල්ලේම සාමාජිකයින් 2023 වර්ෂයේද එම කමිටු සඳහා නම් කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී.ඒ අනුව ඒ සඳහා ගරු මහා සභාවේ ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී. |

09. කම්මල වෙරළ තීරයේ පිරිසිදු කිරීමක් 2022-11-25 වන දින පැවැත් වූ බවත් ඒ සඳහා සහයෝගය ලබා දුන් පරිසර කමිටුවේ ගරු සභාපති ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ඇතුළු සියළුම දෙනාට ස්තූතිය පුද කරන ලදී.ගමේ ජනතාව විශාල ලෙස සහයෝගය ලබා දුන් බවත්,ජනතාවගේ අනුග්‍රහය මේ සඳහා ලැබුණ බවත්, මන්ත්‍රීවරුන්ද සහභාගී වූ බවත් සියළුම දෙනාට ස්තූතිය පුද කරන ලදී.

10. 2022-11-29 වන දින වෙන්නප්පුව කොටසේ වරිපනම් තක්සේරු කටයුතු අවසන් කල බව තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් ලිඛිතව දැනුම් දී ඇති බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.ජනවාරි සිට මෙම මුදල් ටික සභාවට ලැබෙන බවත් ප්‍රකාශ කරන ලදී.

දැනට සිටින ලේකම් මහතා විසින් තමන්ගේ දෙයක් ලෙස සලකා මෙම කටයුතු ඉතාමත් හොඳින් සිදු කරගෙන යන බවත්,මෙම වසර අවසානයේ එතුමා විශ්‍රාම යන බවත්,මෙම ක්‍රියාවලිය අඛණ්ඩව පවත්වාගෙන යා යුතු බවත්,මේ සඳහා විශේෂ අවධානයක් යොමු විය යුතු බවත්,මේ සියළුම ආදායම් පිළිබඳව සුදුසු නිලධාරීයෙක් පත් කර එම වගකීම එතුමාට භාර දි එම කාර්යය ඉෂ්ඨ සිද්ධ කිරීමට වැඩ පිළිවෙලක් සකස් කල යුතු බවත් ගරු මන්ත්‍රී යූ.ජූඩ්.එම්මානුවෙල් මහතා ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතා පැවසූ දෙය නිවැරදි බවත්,මෙහිදි මාසික ප්‍රගතියද සලකා බලන ලෙසත් ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

5% වරිපනම් ප්‍රතිශතය 4% කරන බවට තමන් පොරොන්දු වී ඇති බවත්,දැන් එකතු කරන මුදලට වඩා තුන්ගුණයකින් මෙය වැඩි වන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙම වැඩ සටහන වර්තමාන ලේකම් මහතා විසින් ඉතාමත් හොඳින් සිදු කරන බැවින් එතුමා විශ්‍රාම ගිය පසුවද දෛනික හෝ ක්‍රමවේදයක් යටතේ එතුමාව මේ සඳහා ගෙන්වා මෙය යාවත්කාලීන කරමුයැයිද ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.
ලේකම්වරයා ලෙස කටයුතු කර තමන් විශ්‍රාම යන බවත්, මේ සඳහා තමන් ඕනෑම සහයෝගයක් ලබාදෙන බවත්,නමුත් නැවත ලේකම් තනතුරට පහළ තනතුරක් තමන් භාර නොගන්නා බවත් ලේකම් මහතතා ප්‍රකාශ කරන ලදී.
කාන්තා මන්ත්‍රීවරියන්ට හෙට දින කල්පිටිය ප්‍රාදේශීය සභාව මඟින් වැඩ සටහනක් සූදානම් කර ඇති බවත්,මේ සඳහා සහභාගී වන ලෙසත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.මෙය හෝටලයක පවත්වන බවත්,දීමනාවක්ද ලැබෙන බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

11. පොල්ගහවෙල ප්රාදේශීය සභාවේ ලේකම් මහතා හදිසි හෘදයාබාධයකට ලක්ව ඇති බැවින් හෘද සැත්කම සිදු කිරීම සඳහා දායක මුදලක් සහා අරමුදලින් වැය දැරීම සුදුසු බවට ගරු සභාපතිතුමා යෝජනා කරන ලදී.

බල ප්‍රදේශයේ පුරවැසියෙකු ඉල්ලීමක් කරන විට එය ලබාදීමට නොහැකි වී වෙනත් පාර්ශව වලට ලබා දීම සුදුසු නොවන බවත්,2021 නොවැම්බර් මස 24 වන දින යැවූ ලිපියට අනුමැතිය 2022 නොවැම්බර් මස ලැබුණ බවත්,යම් රෝගීන් මිය ගොස් ඇති බවත් ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

සභාවේ ජ්‍යේෂ්ඨතම මන්ත්‍රීතුමා අසනීප වූ පසුව අප විසින් වෙනත් ආයතන වලට එය නොයැවූ බවත්,නමුත් පළාතේම තිබෙන සියළුම නම් ලැයිස්තුව සභාවට එවන බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව එම ඉල්ලීම ගරු මහා සභාව විසින් ප්‍රතික්ෂේප කරන ලදී.

12. 2022 නොවැම්බර් මස පහත සඳහන් මාර්ග වල වලවල් ප්‍රිමික්ස් අතුරා සංවර්ධනය කිරීමට හැකි වූ බවත් ඒ සදහා සහයෝගය ලබා දුන් සියළුම දෙනාට ස්තූතිය පුද කරන ලදී.

- දුම්මලදෙණිය රෙජිස්ටාර් මාවත
- සිංගක්කුලිය මැද ගොඩැල්ල පාර
- යෝගයාන ධර්ම විජය මාවත
- දන්කොටුව සති පොල
- බොරලැස්ස තිඹිර මාවත
- බොරලැස්ස දුම්රිය ස්ථාන පාර
- උල්හිටියාව කඩවත පාර කෙලවර කොටස
- බණ්ඩිරිප්පුව ගාලවත්ත ප්‍රධාන පාර

13. 2023 වර්ෂයේ සංවර්ධන සැලැස්ම හා පුහුණු සැලැස්ම අනුමත කිරීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා ඉදිරිපත් කරන ලදී.

මෙය සභාගත කරන ලෙසත්,අනුමැතිය දුන් පසුව සභාගත කර පලක් නොවන බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

සැලැස්ම තිබෙන බවත්, එය බලා සංශෝධන තිබේ නම් ඉදිරියේදී එය ඉදිරිපත් කරන ලෙසටත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

| |
|---|
| තීරණ අංකය 08<br><br>2023 වර්ෂයට අදාල සංවර්ධන සැලැස්ම හා පුහුණු සැලැස්ම අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා ගරු මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී. |

14. මාර්ග 4013ක ගැසට් පත්‍රය තිබෙන බවත්,සභාව සතු මාර්ග මෙහි තිබෙන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ඉදිරියේදී කොට්ඨාස මට්ටමින් මාර්ග ටික ලබා දෙන ලෙසට තමන් ඉල්ලීමක්ද කර තිබෙන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

15. සභාව මඟින් සිදු කල යුතු උපහාරයක් තිබෙන බවත්,ලේකම් මහතා මාරු වී වෙනත් ස්ථානයකට නොයන බවත්,ලේකම් මහතාගේ වසර 30ක සේවා කාලයේ අවසන් වසර කීපය අපත් සමඟ එතුමා කටයුතු කල බවත්,විශාල වැඩ කොටසක් අප සිදු කල බවත්,වයඹ අභිමානය යන නාමය වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවට එතුමා ගෙන ඒමටත් කැපවී වැඩ කටයුතු කල බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.ලේකම් මහතා විසින් සිදු කල විශාලම කාර්යභාරය නම් පෞද්ගලික ලිපි ගොණු සම්පූර්ණ කර නොතිබූ කණිෂ්ඨ සේවකයින්ගේ ලිපි ගොණු සකස් කිරීම බවත්,එතුමා නිවාඩු දින වල මේ සඳහා කැප වී කටයුතු කල බවත් ඕනෑම සේවකයෙකු විශ්‍රාම ගිය පසුව මේ වන විට එම විශ්‍රාම වැටුප ගතහැකි ආකාරයට එම වැඩකටයුත්ත මෙතුමා සිදු කර ඇති බවත් ප්‍රාකාශ කරන ලදී.ලේකම් මහතා සිදු කල කාර්ය භාරය වචනයෙන් විස්තර කිරීමට නොහැකි බවත්,වැඩ කිරීමේදී අඩුපාඩු තිබෙන බවත් යම් විට තමන්ද ඉක්මනින් වැඩ කටයුතු සිදු කරන ලෙසට පවසන බවත්,වයඹ අභිමානය යන තැනට සභාව යොමු කර එම ගමන අපත් සමඟ පැමිණි ලේකම් මහතාට වෙන්නප්පුව ප්‍රා දේශීය සභාවේ සියළුම මන්ත්‍රී මණ්ඩලයේ සුභාසිංශනය ගෞරවය ස්තූතිය පුද කරන බවත්, සභාවේදී ලේකම්වරයෙකුට උපහාරයක් දීමට හැකි උපරිම අවස්ථාව මෙය බවත් පක්ෂ විපක්ෂ සියළුම මන්ත්‍රීවරුන් මෙහි සිටින බවත් ප්‍රකාශ

කරන ලදී.මාර්ග සිතියම්ගත කිරීම, CAT-2020 වැඩ සටහන ආරම්භ කිරීමට මෙතුමා කටයුතු කල බවත්, සභාවට බල ප්‍රදේශයට සිදු කල සේවාව නිරතුරුව මතකයේ තිබෙන බවත් තම හද පතුලේ තිබෙන හෘදයාංගම ස්තූතිය වෙන්නප්පුව බල ප්‍රදේශයේ ප්‍රධාන පුරවැසියා ලෙස පුද කරන බවත්,ලේකම් මහතාට විශ්‍රාම සුවය ලැබේවායිද,නීරෝගීව සතුටින් කාලය ගත කිරීමට ලැබේවායිද ප්‍රාර්ථනා කරන ලදී.වෙන්නප්පුව යන නාමය අමතක නොකරන ලෙසත්,මන්ත්‍රීවරයෙකු හෝ නිලධාරීයෙකු හෝ උපදෙසක් ගැනීමට කතා කලහොත් නොපිරිහෙලා ඉටු කර දෙන ලෙසත් ඉල්ලමින් තම කතාව අවසන් කරන ලදී.

✪ ගරු සභාපතිතුමාගේ හා ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහා සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත් කර ලේකම් මහතාට එතුමාගේ අදහස් ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව සලසා දෙන ලදී.

ලේකම් මහතා ගරු සභාපතිතුමා,ගරු උපසභාපතිතුමා,ගරු විපක්ෂ නායකතුමා,කාරක සභා ගරු සභාපතිවරුන් ඇතුළු සියළුම මන්ත්‍රීවරුන්ගෙන් අවසර ගැනීමෙන් පසුව අද දින ඇත්තෙන්ම සතුටු දිනයක් බවත් ,තමන් ද ගරු මන්ත්‍රීවරුන්ගෙන් සමු ගැනීමට අද දින අවස්ථාවක් ලැබේයැයි බලාපොරොත්තුවෙන් සිටි බවත් ප්‍රකාශ කරන ලදී.

මින් පෙර ආයතනයෙන් ආයතනයට ස්ථාන මාරු ගිය බවත්,එවිට විශේෂයෙන් උපහාරයක් සමු ගැනීමක් අවශ්‍ය නොවන බවත්,රාජ්‍ය සේවකයෙකු ලෙස එලෙස යාමට සිදු වන බවත්,නමුත් අද දින සියළුම දෙනා සමඟ සිටින අවසන් මහා සභාව බවත්, රාජකාරීමය වශයෙන් තමන් අසුන් ගන්නා අවසන් මහා සභාව මෙය බවත් ලේකම් මහතා ප්‍රකාශ කරන ලදී. වසර 04ක් පමණ ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ සේවය කර 1989 වකවාණුවේ ඉවත් වීමට සිදු වූ බවත්, තම ආරක්ෂාව වෙනුවෙන් ගරු අමරා පියසීලි රත්නායක ඇමතිතුමිය ලඟ වැඩ කටයුතු කල බවත්,එතැන වසරක් දෙකක් සිටියදී විභාගය ලියා ගිරිබාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලිපිකරු තනතුරට පැමිණි බවත් එතැන සිට මාස කීපයකින් ආරච්චිකට්ටුව ප්‍රා දේශීය සභාවට පැමිණ එතැනින්ද මාස කීපයකින් හලාවත ධීවර අමාත්‍යාංශයට පත් වීම ලැබී වසර 9ක් පමණ එහි රාජකාරි කටයුතු සිදු කල බවත් ප්‍රකාශ කරන ලදී.ඉන් පසුව හලාවත නගර සභාවට පත් වීමක් ලැබුණ බවත්, මධ්‍යම රජයේ සිට පළාත් පාලන ක්ෂේත්‍රයට පැමිණීමට අකමැත්තෙන් තමන් පැමිණි බවත්,නමුත් මාස 3ක් පමණ ගත වූ පසුව මෙහි තිබෙන අපූර්වත්වය තමන් දුටු බවත්, අමාත්‍යාංශයේ සිටියදී මුළු වයඹ තිබෙන සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට ගොස් සංවර්ධන වැඩ කටයුතු වලට දායක වූ බවත්,වයඹ පලාත් සභාවේ සිටියදී තමන්ට අම්මා කෙනෙකු සේ ලැරින් පෙරේරා මැතිණිය සැලකූ බවත්,එතුමිය යටතේ සංවර්ධන කටයුතු වලට තමන් සහභාගී වූ බවත්,පලාත් පාලනයේත් ඒ හා සමානව වැඩක් කිරීමට හැකි බව තේරුම් ගෙන තමන් කටයුතු කල බවත්,හලාවත නගර සභාවේ මෙන්ම බින්ගිරිය ප්‍රාදේශීය සභාවේද තමන් සේවය කල බවත් ඉන්පසුව සුප්‍රා විභාගය සමත් වී තමන්ට මාදම්පේ ප්‍රාදේශීය සභාවට පත්වීම ලබා දී තිබුණද එය නොලැබී ලේකම් කෙනෙකු ලෙස ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාවට සේවයට ගිය බවත් ප්‍රකාශ කරන ලදී. අත්දැකීම් සමඟ සතුටු වීමට හැකි දේ තමන්ට තිබෙන බවත්,සියල්ලම තම ජීවිතයේ හොඳට සිදු වූ බවත්, ආරච්චිකට්ටුවට ගිය විට මන්ත්‍රීවරුන් නොමැතිව පාලනය කිරීමට අවස්ථාව උදා වූ බවත්,පණතේ 9(III) වගන්තිය යටතේ තීන්දු තීරණ ගෙන වැඩ කටයුතු රාශියක් සිදු කිරීමට හැකි වූ බවත් තමන්ව ගෙදර යැවීමට එම ආයතනයට යොමු කල බවත් නමුත් යාමට හැකි උපරිම ස්ථානයට තමන් ගිය බවත් ප්‍රකාශ කරන ලදී.අදටත් ආරච්චිකට්ටුව කාර්යාල ගොඩනැඟිල්ලේ ඉදිරිපස "දැන් අපි වෙනස් වෙලා.වෙනත් කෝණයකින් බලන්න" යන්න පුවරුවක් තිබෙන බවත්,තමන් එහි ගොස් පළමුව එය ඉදි කල බවත් ප්‍රකාශ කරන ලදී.හරිත කොදෙව්ව සඳහා පලාත් සභා අමාත්‍යාංශයෙන් කෝටි 2 ½ දෙන විට ක්‍රීඩා අමාත්‍යාංශයෙන්ද ලක්ෂ 50 ක මුදලක් ලබාගත් බවත්, එවැනි ස්ථානයක් වයඹ පලාතේ කිසිදු ස්ථානයක නොමැති ගිමන් හරින ස්ථනයක් බවත්, එහි වහලය නව නිර්මාණයකට අනුව සකස් කල බවත් ඉන්පසුව ආරච්චිකට්ටුවෙන් තමන් පැමිණි බවත් ප්‍රකාශ කරන ලදී.

තමන් මෙම සභාවට පැමිණීමට පෙර ගරු සභාපතිතුමාද තමන් පිළිබඳව සොයා බැලූ බවත්,තමන් එය නොදන්නවා නොවේයැයිද,බොහෝ ස්ථාන වලින් තමන් නීතිකාරයෙකුයැයි සලකා තමාව භාර ගැනීමට මැලි වූ බවත් ලේකම් මහතා ප්‍රකාශ කරන ලදී.එය සත්‍ය බවත්, තමන් නීත්‍යානුකූලව සියළුම වැඩ කටයුතු සිදු කරන බවත් කෙසේ නමුත් තමන් මෙම ආයතනයට පැමිණීමට පෙර සියළුම තොරතුරු විශ්ලේෂණය කරගෙන පැමිණි බවත්, 2019 වර්ෂයේදී මහා සභාවට පැමිණ හඳුනාගෙන ඉදිරියට වැඩ

කටයුතු කරගෙන ආ බවත් ප්‍රකාශ කරන ලදී. තම ගම කුරුණෑගල දිස්ත්‍රික්කයේ වුවාට තමන් වැඩි හරියක් පුත්තලම් දිස්ත්‍රික්කයේ වැඩ කටයුතු කල බවත්,දැන් තමන්ට අදටත් මින් එහාටත් දියුණු වෙනවාට කැමතිම ස්ථානය වෙන්නප්පුව බවත් තමන් යමක් කරනුයේ වෙන්නප්පුව ගැන සිතා බවත්,මන්ත්‍රීවරුන්ට ගරු සභාපතිතුමාට තමන් ආදරේ බවත් ඊටත් වඩා වෙන්නප්පුව බල ප්‍රදේශයට ආදරේ බැවින් යම් විට තමන් යම් යම් දේ පැවසූ බවත් මේ සියල්ලම සිදු කලේ මේ සභාවට බවත්, මෙ සියළුම දෙනා නොසිටියේ නම් මෙම ගමන යාමට තමන්ට නොහැකි වන බවත් ප්‍රකාශ කරන ලදී.තමන් සෑම විටම සම්ප්‍රදායිකව ලැබෙන පුංචි පුංචි වැඩ පමණක් සිදු නොකරන බවත්,වයඹ පලාතේම පෞද්ගලික ලිපි ගොණුවක ගැටළුවක් තිබේ නම් එය තමන්ට එවන බවත්,ඒවා සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවද තමන්ව පිළිගෙන තිබෙන බවත් අදටත් වෙනත් අයගේ පෞද්ගලික ලිපි ගොණු තමන් නිවසට ගෙන ගොස් සාදා දෙන බවත් ප්‍රකාශ කරන ලදී.සෑම විටම රාජ්‍ය සේවකයෙකු ලෙස තම කුලකය තමන් ආරක්ෂා කරන බවත්,තමන්ද ලිපිරුවෙකු ලෙස රාජ්‍ය සේවය ආරම්භ කල බවත් ප්‍රකාශ කරන ලදී.
මෙහි සේවය කල විමලා නම් සේවක මහත්මිය විශ්‍රාම ගිය පසුව ඇයට විශ්‍රාම ගෙවීමට නොහැකි තත්ත්වයක් තිබූ බවත් නමුත් එය තොරතුරු ලබා ගෙන සකස් කර මේ වන විට ඇය විශ්‍රාම වැටුප ලබා ගන්නා බවත් ප්‍රකාශ කරන ලදී.එය එකක් පමණක් බවත්,ලිපි ගොණු කිසිවෙක මේ වන විට අඩුපාඩු නොමැති බවත්,තමන් වැඩ කටයුතු කරගෙන යන විට තමන් කතා කරන ශෛලය පිළිබඳව,නුරුස්නාගතිය පිළිබඳව,වැඩ කටයුතු කරන ආකාරය පිළිබඳවද ගැටළු ඇති බවත් තමන් කිරීමට නොහැකි දේ සිදු නොකරන බවත් ප්‍රකාශ කරන ලදී.පලාත් පාලනය තුල නීති තිබෙනුයේ වැඩ නතර කිරීමට නොවන බවත්,හැකි තාක් ගැලපීම් කර එය සිදු කල යුතු බවත්,නීතිය ගලපා ගැනීමට හැකි නම් කෙසේ හෝ ගලපා එම වැඩ කටයුත්ත සිදු කල බවත් අද වන තෙක් විගණන කලමනාකරණ කමිටුවට හෝ ගිනුම් කාරක සභාවට කිසිඳා ගැටළුවක් නොගිය බවත්,විගණනයට පිළිතුරු ලිවීමට තමන් දන්නා බවත් මේ වසර 3 තුල සියළු දෙනාම බේරා කටයුතු කල බවත් ප්‍රකාශ කරන ලදී.

දෙපාර්තමේන්තුවේ උපදෙස් ද පරිදි වරිපනම් සීමා නැවත ගැසට් කිරීමට මන්ත්‍රීවරුන්ව කැමති කර ගත් බවත්,අද වන විට ගැසට් කල වරිපනම් සීමා සිතියම් තිබෙන බවත්,ඉතිරි වසර 25කටවත් මෙම සීමාව වෙනස් නොවන බවත් ලේකම් මහතා ප්‍රකාශ කරන ලදී.වයඹ පලාතේම වැඩිම මාර්ග සංඛ්‍යාවක් වෙන්නප්පුව බල ප්‍රදේශයේ තිබෙන බවත්,එම වැඩ කටයුත්ත සඳහා ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයද සහයෝගය ලබා දුන් බවත්, 10 දෙනෙකු බඳවා ගැනීමට ගිය විට උසස් පෙළ සමත්,තාක්ෂණය පිළිබඳව දැනුමත් ඇති 10 දෙනෙකු ගැනීමට හැකි වූ බවත්,ඔවුන් 10 නිසා වයඹ පලාතේ අංක එකට නම තබා ගෙන සිටින බවත් ප්‍රකාශ කරන ලදී.එක් හත්දහස් ගනනක් පමණ තිබූ වෙන්නප්පුව ප්‍රදේශයේ වරිපනම් ඒකක මේ වන විට 9000 පමණ වන තෙක් වැඩි කර ගැනීමට හැකි වී ඇති බවත් හතර ගුණයකටත් වඩා වැඩි ස්ථාවර ආදායමක් සභාවට ඉදිරියේදී ලැබෙන බවත් ප්‍රකාශ කරන ලදී.ස්ථාවර තැන්වලට යාමට තර්ක විතර්ක සමඟ කමිටු මඟින් සභාව මඟින් අවශය සහයෝගය ලබා දුන් බවත් ,අද වන විට පිට පලාත් වලින් අප සභාවට පැමිණ උපදෙස් ලබා ගන්නා බවත් වයඹ පලාතේ ඉහළම ස්ථානයක අද වන විට අප සිටින බවත්,වරිපනම් ඒකක GIS තාක්ෂණය ඔස්සේ සිදු කර ලේඛණගත කිරීම ලංකාවේ අද වන විට කිසිඳු තැනක සිදු කර නොමැති බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.තමන් කොතැන සිටියත් එය අංක එක විය යුතු බවත්,මෙම පැමිණි ගමනේදී ගරු සභාපතිතුමා විශාල සහයෝගයක් ලබා දුන් බවත්,කමිටු සභාපතිවරුන්ද සහයෝගය ලබා දුන් බවත්,විපක්ෂනායකතුමා තමන් දෙයක් ගෙනා විට එකවර එය භාර නොගත් බවත්,සන්වාද විවේචන සමඟ එතුමා තර්ක කල බවත් එලෙස සිදු කල උදව්ව නොතිබුණා නම් මෙම ගමන යාමට නොහැකි බවත්,එතුමා හුඟාක් තැන් පෙන්වා දුන් බවත් ප්‍රකාශ කරන ලදී.තම මුළු රාජකාරී කාලයට වැඩි කාලයක් එතුමා හා ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රී ධූරය දරා ඇති බවත් ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ගොඨාභය වික්‍රමසිංහ මහතා වරින් වර දුරකථනයෙන් කතා කරමින්,දෙපාර්තමේන්තුවට කතා කරමින් CAT-2020 වැඩ සටහන සඳහා සහයෝගය ලබාදුන් බවත් එයද අය කරන බවත් ප්‍රකාශ කරන ලදී.

මෙම කාර්යාලයේ වැඩි කාලයක් ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා සිටි බවත්,එතුමා සමඟ නිතරම කතා කරමින් මෙම වැඩ කටයුතු සිදු කිරීමට හැකි වූ බවත් පවසමින් සියළුම දෙනා ලබා දුන් සහයෝගයට ස්තුතිය පුද කරන ලදී. ''වයඹ අභිමානය'' ලෙසින් මෙම සභාව සංකේතවත් කිරීම සඳහා තමන් විසින් ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ හා තමන්ගේ රාජකාරී

හැඳුනුම්පත් දෙක''වයඹ අභිමානය'' තේමාවද ඇතුලත් කර සකස් කර එය ගරු සභාපතිතුමාට හා ගරු මන්ත්‍රීතුමාට'' වයඹ අභිමානය'' පිළිබඳව කිසිවක් නොපවසා එය පෙන්වූ බවත් ඉන් පසුව ඒ සඳහා ගරු සභාපතිතුමාගෙන්ද අනුමැතිය ගෙන හැඳුනුම්පත් සියල්ල සූදානම් කල බවත්,ටිකෙන් ටික තම සිහිනය ගරු සභාපතිතුමාගේද මන්ත්‍රීවරුන්ගේද ඔළුවට දැමූ බවත්,ගරු සභාපතිතුමා කතා කරන විට එම වචනය එළියට පැමිණි බවත්,පිබිදෙන පුරවරය ලෙස පැවසූ විට ආරච්චිකට්ටුව ලෙස මෙන්ම වයඹ අභිමානය ලෙස පැවසූ විට වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවද මුළු ලංකාවම දන්නා බවත්, මේ වන විට අප සභාවේ ලෙටර්හෙඩ් එකේද එය සඳහන් කර ඇති බවත් ප්‍රකාශ කරන ලදී. තමන්ට උදව් කල සතුටින් යාමට සහය වූ ඉහළම තැනේ සිට පහළම සේවක මහත් මහත්මිය දක්වාම සියළුම දෙනාට ස්තූතිය පුද කරන ලදී.තීන්දු තීරණ ගැනීමේදී යම් අයට ගැටළු මතු වූ බවත්, ගරු සභාපතිතුමා සමඟ තමන් වැඩ කටයුතු කල බවත්,එතුමා මෙතැන ආයතන ප්‍රධානියා මෙන්ම ගණන්දීමේ නිලදාරියා බවත් එතුමා සමඟ එකට එකතු වී සාකච්ඡා කර තීන්දු තීරණ ගත් බවත් ප්‍රකාශ කරන ලදී.මාර්ග අමාත්‍යාංශයේ වැඩිම පාරවල් සංඛ්‍යාවක් සෑදුවේ අප බවත්,පලාත් පාලන අමාත්‍යාංශයේ වැඩිම වාර ගණන් අප සභාවේ නම් කියවෙන් බවත් එලෙස තැනකට මෙය සකස් වූ බවත් එතුමා  වැඩ කටයුතු කල ආකාරය තමන් දුටු බවත් ප්‍රකාශ කරන ලදී.අඩුපාඩුවක් සිදු වී වරදක් සිදුවූයේ නම් සමාව අයද සිටින බවත්,හිතාමතා සිදු නොකල බවත්, තම සේවා කාලයෙන් පසුව තවත් වසරක සේවා දිගුවක් අහඹු ලෙස ලැබුණ බවත්,මේ සියල්ල තම වාසනාව සමඟ ලැබුණ බවත් ප්‍රකාශ කරන ලදී.සුන්දර ගමනක් පැමිණි බවත්,රාජ්‍ය සේවයෙන් තමන් පමණක් විශ්‍රාම යන බවත්,ඒ තුළින් ලබා ගත් දැනුම ආකල්ප විශ්‍රම නොයන බවත්,ඕනෑම අවස්ථාවක අවශ්‍ය සහය ලබා  දෙන බවත් ,නැවත තනතුරු භාර ගැනීමකින් තොරව ඉදිරියටත් දැනුම හා ශක්ති ලබාදෙන බවත් ප්‍රකාශ කරන ලදී.මෙම අවස්ථාව ලබා දීම පිළිබඳව සියළුම දෙනාට ස්තූති කරමින් තමන් සතුටින් සිටි බවත් සතුටින් යන බවත් පවසමින් තම කතාව අවසන් කරන ලදී.

- ගරු මන්ත්‍රී ඩබ්.ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතා සියළුම දෙනාගෙන් අවසර ගැනීමෙන් පසුව  අද වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවට විශේෂ අවස්ථාවක් බවත්,මෙය ලේකම් මහතා අප සමඟ කටයුතු කරන අවසන් මහා සභා රැස්වීම බවත් එතුමාව තමන්ට ආශ්‍රය කිරීමට හමුවූයේ එතුමා ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාව තුළ කටයුතු කල අවස්ථාවේදී බවත් එතුමා අප සභාවට පැමිණෙන බව පැවසූ විට තමන්ට සතුටක් දැනුන බවත් ප්‍රකාශ කරන ලදී.එතුමා ඉතාමත් දක්ෂ අන්දමින් සියළුම දෙනා සමඟ තර්ක විතර්ක කර එකමුතුව,සියළු දෙනාගේම සහයෝගය ගෙන වෙන්නප්පුව ප්‍රා දේශීය සභාව මෙම තත්ත්වයට ගෙන ඒමට විශාල සහයෝගයක් ලබා දුන් බවත්,සෑම දාම නම තැබූ ප්‍රාදේශීය සභාවක් ලෙස මේ වන විට වයඹ අභිමානය සමඟ ඉදිරියටම පැමිණ ඇති බවත්,ලේකම් මහතා එතුමාගේ සේවක පිරිසත් සමඟ විශාල සහයෝගයක් ලබා දුන් බවත් ප්‍රකාශ කරන ලදී.එතුමාට සුභාශිංසනය ප්‍රාර්ථනා කරමින් විශ්‍රාම සමය දරු මුණුබුරන් සමඟ සතුටින් ගත කිරීමට දේවආශිර්වාදය ලැබේවායිද ප්‍රාර්ථනා කරමින් අපෙන් සිත් රිදවීමක් ඇති වූයේනම් කණගාටුව ප්‍රකාශ කරන බවත් රාජ්‍ය සේවයේ ස්වභාවය එය බවත් සුභ අනාගතයක් ලේකම් මහතාට ප්‍රාර්ථනා කරන ලදී. එමෙන්ම ලබන්නාවූ මෙම නත්තල හා 2023 වර්ෂය සියළු දෙනාටම සුභ වේවායැයිද,පසුගිය වසරට වඩා 2023 වසරේදී මුළු ශ්‍රී ලංකා වාසී සියළුම දෙනාටම යහපත් වසරක් අත්දැකීමට වාසනාව ලැබේවායිද ප්‍රාර්ථනා කරමින් තම කතාව අවසන් කරන ලදී.

- ගරු මන්ත්‍රී කේ.නාමල්අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා සියළුම දෙනාගෙන් අවසර ගැනීමෙන් පසුව මෙම අවස්ථාවේදී ලේකම් මහතා පිළිබඳව යමක් කතා කිරීමට අවශ්‍යව තිබෙන බවත්,පසුගිය කාලයේදී මෙම ලේකම් මහතා අප සභාව සම්බන්ධයෙන් නිරන්තරයෙන් කටයුතු කල බවත්,තමන් එය දුටු බවත් තමන්ගෙන්ද නීතිය සම්බන්ධයෙන් යම් දේ විමසූ බවත් ඒ අනුව කටයුතු කර ඇති බවත් ප්‍රකාශ කරන ලදී.පසුගිය කාලය තුළ විශාල ජයග්‍රහණ රාශියක් ලබා ගැනීමට හැකි වූයේ ලේකම් මහතාගේ සහයෝගය ගරු සභාපතිතුමාට ලැබුණ නිසා බවත්, ඉඩම් ලබා ගනිමින් වත්කම් වැඩි කර ගැනීමටද සභාවට හැකි වූ බවත් එමෙන්ම යම් නඩුහබ වලින්ද ජයග්‍රහණය ලබා ගැනීමට හැකි වූ බවත්,ඒ සියල්ල ලේකම් මහතාගේ ශක්තිය ධෛර්ය හා සොයා බැලීම නිසා සිදු බවත් ප්‍රකාශ කරන ලදී.මාර්ග ලැයිස්තුගත කිරීමට හැකි වී තිබෙන බවත්,සභාව සතු ඉඩම් සම්බන්ධයෙන් දැනටත් ලැයිස්තුවක් සාදාගෙන යන බවත්, ලේකම් මහතා යාමට පෙර එම ඉඩම් ලැයිස්තුවද සභාව සතු කරාවියැයි තමන් සිතනා බවත් ප්‍රකාශ කරන ලදී.මේ ආකාරයට සක්‍රීය  වැඩ කොටසකට දායකත්වයක් ලබා දුන් ලේකම් මහතාගේ විශ්‍රාම දිවියට සුභ පතන බවත් එම කාලය තුලත් රටට දැයට සේවයක් කිරිමට ශක්තිය ලැබේවායිද ප්‍රාර්ථනාකරන ලදී.වෙන්නප්පුව ප්‍රා දේශීය සභාවේ ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයටත්, සභාවේ සියළුම සේවක මණ්ඩලයටත් ලබන්නාවූ නත්තල සුභ නත්තලක්

වේවායැයිද ලබන්නාවූ අළුත් අවුරුද්ද හොඳ වසරක් වේවායැයි ප්‍රශ්න විසඳෙන වසරක් වේවායැයි ප්‍රාර්ථනා කරමින් තම කතාව අවසන් කරන ලදී.

- ගරු මන්ත්‍රී යූ.ජුඩ් එම්මානුවෙල් මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළුම දෙනාගෙන් අවසර ගැනීමෙන් පසුව තමන් රාජ්‍ය නිලධාරියෙකු ලෙස තම සේවා කාලය තුළත් තමන් බලාපොරොත්තු වූ නිලධාරී මහතෙකු ලෙස මෙතුමාව හැඳින්විය හැකි බවත්,වැඩ කල් නොදැමීම මෙතුමා තුළින් දුටු බවත්, තමන් නිතරම ලේකම් මහතා හමුවීමට ගිය විට එතුමාගේ මේසය උඩ ලිපි ගොණු රැසක් දකිනා බවත්, එතුමා ඒවා නිවසට ගෙන ගොස් සාදාගෙන පැමිණෙන බවට පවසන බවත් ඒ සියල්ල කරනුයේ මහජන මුදලින් වැටුපක් ලබන නිලධාරියෙකු ලෙස එතුමාගේ සිත තුළ තැන්පත් වී ඇති තමන්ට ගෙවනා වැටුප වෙනුවෙන් ජනතාවට සේවයක් කලයුතුයැයි යන හැඟිම නිසා බවත් ප්‍රකාශ කරන ලදී.උදෑසන 8.30සිට සවස 4.30 වන තෙක්ද ,වෙනත් දීමනාවක් නිවාඩු දිනයක ලබා ගැනීමටද යන්නන එතුමා කල්පනා නොකල බවත්,සෑම විටම තමන් කුමක් හෝ දෙයක් කිරීම පිළිබඳව සිතන බවත්,එතුමාම තමන් පහසු දේ නොව විශේෂ වූ දේවල් සිදු කරන බව පැවසූ බවත් ප්‍රකාශ කරන ලදී.ගරු සභාපතිතුමාගේ මේසය උඩ තිබෙන මාර්ග ගැසට් කල පොත දක්වා එම කටයුත්ත කාර්යයන් බොහෝමයක අවසන් ප්‍රතිඵලය බවත්,දවස් ගණනාවක් පැය ගණනාවක් මෙතුමා එම සේවක මහත්ම මහත්මීන් සමඟ ගත කර යම් දේට දොස් පවරමින් යම් දේට හොඳ පවසමින් කෙසේ හෝ මෙය සිදු කල බවත්,තමන් මෙම කාර්යය පිළිබඳව පෞද්ගලිකව දන්නා බවත් ප්‍රකාශ කරන ලදී.අප සියළු දෙනාටම විශාල ආදර්ශයක් හා අවවාදයක් එතුමාගේ සේවා කාලය තුළ ලබා දී ඇති බවත්,"සතුටින් යන්න" යැයි එතුමා පැවසූ බවත්,අද වන විට ඉතාමත් අසතුටින් බොහෝ නිලධාරීන් විශ්‍රාම යන බවත් නමුත් මෙතුමා තමන් සිතුටින් යන බව පැවසූ බවත්,අද වන විට මෙම සතුට සමාජයේ අඩුවෙන් භාවිතා කරන අඩුවෙන් ලැබෙන දෙයක් වී තිබියදී මෙතුමා අපට ආදර්ශයක් ලබා දෙන බවත්, අප යන තැන අවශ්‍ය දේවල් නොපිරිහෙලා ඉටු කර සතුටින් යාමට සූදානම් වන්නයැයි එතුමා අපට පණිවාඩයක් දෙන බවත් ප්‍රකාශ කරන ලදී. ලේකම් මහතා සභාවට පැමිණි දිනයේ සිටිම මෙම රාජකාරී කටයුතු වලට ඉතාමත් ආසන්නයෙන් ඇසුරු කල බවත්,එතුමා ඒ ඒ කාර්යයන් වලදී බල ප්‍රදේශයේ ජනතාවට දැක්වූ කැමැත්ත, යමක් කිරීමේ හැකියාව අතිශයින් වැදගත් වන බවත්,ඒ සියළු දේ වෙනුවෙන් එතුමා විෂයන් ගණනාවකට නායකත්වය ලබා දුන් බවත් ඒවා වඩාත් නිවැරදිව හා කාර්යශූරව ඉටු කිරීමට එතුමා වග බලාගත් බවත් එබැවින් එම සතුට එතුමාට තිබෙන බවත් ප්‍රකාශ කරන ලදී.නිවාඩු අවස්ථාවේදීද යමක් කර අවසානයේ ගෙදර යනවායැයි සතුටු හැඟීම එතුමා ලබා ගත් බවත්,එතුමාටද යම් දේ නැති වන්නට ඇතැයිද නමුත් එතුමා සතුට ලබා ගත් බවත් ප්‍රකාශ කරන ලදී.මේ වසරේ දෙසැම්බර් මස 31 වන දින දක්වා ලේකම් ධූරය හොබවන ලේකම් මහතාට තම ගෞරව පූර්වක ස්තුතිය පුද කරන බවත්,එතුමාට චිරාත්කාලක් සේවය කිරීමේ හෝ වැඩක් කිරීමේ හැකියාව එතුමාට තිබෙන බවත් එවැනි කාර්යයකට උරදෙන ලෙසට ඉල්ලමින්ද, එතුමාගේ දැනුමින් විපුල ප්‍රයෝජනයක් ගැනීමට එතුමාට අවශ්‍ය අවකාශය ලබාදෙන ලෙසද ඉල්ලමින් එතුමාට සුභාශිංසනය පිරිනමමින් තම කතාව අවසන් කරන ලදී.

- ගරු මන්ත්‍රී ඩබ්.ජොන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළුම දෙනාගෙන් අවසර ගැනීමෙන් පසුව අද දින 2022 වර්ෂයේ අවසන් මහා සභා රැස්වීම පැවැත්වෙන බවත් එමෙන්ම අද දින සුවිශේෂී දිනයක් බවත් මෙවැනි මහා සභාවකදී තම විශ්‍රාම දිවියට එලඹෙන ලේකම්තුමෙකුට සමු දෙන අවස්ථාවක් හමු වී නොමැති බවත් ප්‍රකාශ කරන ලදී.මෙය ඉතාමත් අභිමානවත් අවස්තාවක් බවත්,මෙය අභිමානවත් බවට පත් වූයේද ලේකම් මහතා මුළු ලංකාවටම වයඹ අභිමානය සමාජගත කල ලේකම් මහතෙකු බවත් මෙතැනදී විශේෂයෙන්ම ලේකම් මහතා කල සේවාව ඇගයිමක් වශයෙන් ලේකම් මහතාට සේවා දිගුවක්ද ලබා දීමට යෝජනා කල බවත්,සාමාන්‍ය යේන් එතුමාගේ වටිනාකමක් නොමැති නම් ලේකම්වරයෙකුට සේවා දිගුවක් යෝජනා නොකරන බවත්,ලේකම් මහතා කමිටු සභාපතිවරුන් සමඟ ඉතාමත් සුහදව කටයුතු කල බවත්,එමෙන්ම ලේකම් මහතාට තාක්ෂණය පිළිබඳව මනා අවබෝධයක් තිබෙන බවත් අළුත් විධියට එතුමා සිතන බවත් ප්‍රකාශ කරන ලදී.තමන්ද අළුත් විධියට සිතන කෙනෙකු සේ එතුමාගේ අදහස් වලට සමීපව ගලපා ගනිමින් පරිසර කමිටුවේ කටයුතු සිදු කල බවත් ප්‍රකාශ කරන ලදී.තවත් දෙයක් සිහිපත් කල යුතු බවත්, තමන් දිනක් මහා සභාවේදීම එතුමාට දන්කොටුව ජල පවිත්‍රාගාරය සම්බන්ධයෙන් දෝශාරෝපණය කල බවත්, අවසානයේදී තමාට කණගාටු සිතුන බවත්,මෙහි යථාර්ථය සොයා බැලූ විට මෙහි සිටින තාක්ෂණ නිලධාරීන්ට අදාල ඇස්තමේන්තුවට අනුව කටයුතු කල නොහැකි බවත් එ් තුළ මෙය ප්‍රමාද වූ බව තමන් තේරුම් ගත් බවත් එවිට අපි දන්නා දේට වඩා නොදන්නා දේ බොහෝ තිබෙන බව තමන්

තේරුම්ගත් බවත් ප්‍රකාශ කරන ලදී.මෙතුමා ඒ සියල්ලම උපේක්ෂාවෙන් බලා සිට එය අපටම අවබෝධ කරගැනීමට අවස්ථාව සැලසූ බවත්, ලේකම් මහතාගේ වටිනාකම නිසාම අද දිනත් තමන් යෝජනා කල බවත් ලේකම් මහතා ගෙනා මාර්ගයේ තවත් ශක්තිමත්ව මෙය මෙහෙයවීම සඳහා වටිනා කාලයෙන් කොටසක් දෙන ලෙසට ඉල්ලූ බවත් ප්‍රකාශ කරන ලදී.විශ්‍රාම සුවය ගත කලද සභාවේ කටයුතු වලට ඇස යොමාගෙන සිටින ලෙසත් මෙහි කටයුතු වලට ඇතින් සිට හෝ අවශ්‍ය උපදෙස් අනුශාසනා ලබා දෙන බවට ලේකම් මහතා පැවසූ බවත් එම කටයුත්ත බලාපොරොත්තු වන බවත් ප්‍රකාශ කරන ලදී.මෙම සභාවට කල සේවයට ගරු සභාපතිතුමාගේ,මන්ත්‍රීමණ්ඩලයේ හා පරිසර කමිටුවේ සභාපතිවරයා ලෙස තමන්ගේ සුභාශිංසනය පුද කරන බවත්,සියළුම දෙනාට ලබන්නාවූ නත්තල හා අළුත් අවුරුද්ද සුභ නත්තලක් හා සුභ නව වසරක් වේවායැයිද පවසමින් තම කතාව අවසන් කරන ලදී.

- ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළුම දෙනාගෙන් අවසර ගැනීමෙන් පසුව දෙසැම්බර් මාසයේ වසර අවසන් වීමට ආසන්නයේදී සුභ කටයුත්තකට අප සහභාගී වන බවත් ලේකම් මහතා වසර 30ක පමණ සේවා කාලයේ පලපුරුද්දෙන් අවසාන කොටස වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවට ලැබුණ බවත්, එතුමා ලබා ගත් අත්දැකීම් වලින් වෙන්නප්පුව පොහොනි කිරීමට විශාල සහයෝගයක් ලැබුන බවත් එයත් වෙන්නප්පුවට ලැබුණ භාග්‍යයක් බවත් ප්‍රකාශ කරන ලදී. කඩිනමින් වැඩ කිරීම එතුමාගෙන් දුටු විශේෂ දෙයක් බවත්,වරිපනම් සීමාව වැඩි කර ගැනීම සඳහා 2009දී යෝජනාව පැමිණි බවත් වසර ගණනාවක සිට තිබූ ව්‍යාපෘති ඉතාමත් කඩිනමින් ක්‍රියාත්මක කර ප්‍රතිපල අත්දැකීමට ලැබුණ බවත් එතුමා තුළ දක්ෂතාවය තිබූ බවත්,නිර්මාණශිලි හැකියාව තිබූ බවත් ප්‍රකාශ කරන ලදී.විශේෂයෙන්ම ගරු සභාපතිතුමාට සෙවනැල්ලක් වූ බවත්,ඒ තුළින් අප ලබා ගත් ප්‍රතිපල බෝහෝ ඇති බවත් ප්‍රකාශ කරන ලදී. ඇත්තෙන්ම රජයේ සේවකයෙකුට ආදර්ශයක් එතුමා තුලින් දුටු බවත්,කාලය නිසි ලෙස යොදා ගනිමින් තම පෞද්ගලික කාලයද සභාව වෙනුවෙන් වැය කල බවත් අපේ රජයේ සේවකයින් මෙලෙස කටයුතු කලහොත් අපේ රට ඉතාමත් හොඳින් මීට වඩා දියුණු කල හැකි බවත් ප්‍රකාශ කරන ලදී. ගැලපීම යන දක්ෂතාවය මෙතුමා තුලින් දුටු බවත්,තම මතයම ක්‍රියාත්මක නොකර ගරු සභාපතිතුමාද සමඟ එකතු වී ගලපා කටයුතු කල බැවින් වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවට විශාල ලෙස ජයග්‍රහණ ලැබුණ බවත් ප්‍රකාශ කරන ලදී.අද තිබෙන තාක්ෂණය,online ක්‍රමවේදය භාවිතා කිරීමට වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව මුල පිරූ බවත්,මේවා තුල ඉදිරියට යාමට නිලධාරීන් යොමු කර ,ඉහළ නිලධාරීන්ගේද සහයෝගය ලබාගෙන කටයුතු කිරීම තුළ වෙන්නප්පුවට ලබා දුන් එම සේවයට වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව ලෙස නැවතත් ස්තූතිය පුද කරන බවත් ප්‍රකාශ කරන ලදී. ලේකම් මහතාගේ අනාගත ඉලක්ක වලට සුභ පතන බවත්,ලේකම් මහතාට ශරීර සෞඛ්‍යය ලැබේවායිද,දීර්ඝායු ලැබේවායිද ප්‍රාර්ථනා කරන ලදී.කර්මාන්ත කමිටුවක් ලෙස විශාල වාද විවාද රැසක් පැමිණි බවත්, ඒවා සියල්ල සහයෝගයෙන් විසඳාගනිමින් කටයුතු කරගෙන ගිය බවත්,ලේකම් මහතාට ස්තූතිය පුද කරමින්ද ,ලබන්නාවූ නත්තල සුභ නත්තලක් වොවායැයිද,2023 වර්ෂය සුභ නව වසරක් වේවායැයිද ප්‍රාර්ථනා කරමින් තම කතා ව අවසන් කරන ලදී.

- ගරු මන්ත්‍රීනී ආර්.නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය ගරු සභාපතිතුමා ඇතුළු සියළුම දෙනාගෙන් අවසර ගැනීමෙන් පසුව ලේකම්තුමා වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවට පැමිණ මහා සභාවකදී එතුමාගේ පිළිගැනීමේ කතාවේදී එතුමා අප සභාව මහා ලොකු බැරුරුම් ප්‍රාදේශීය සභාවක් ලෙස හිසේ තබාගෙන පැමිණි බව තමන්ගේ මතකයේ තිබෙන බවත්, මෙතැන කාර්යභාරය කෙතරම් දුරට ඉටු කිරීමට හැකිවේද,සමත් වේද යන්න සිතනා බව දුටු බවත් ,මෙවැනි ප්‍රාදේශීය සභාවකට පැමිණ කටයුතු කර නොමැති බවත්,මෙය ලොකු දෙයක් බව එතුමා පැවසූ බවත් ප්‍රකාශ කරන ලදී. නමුත් වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව වෙනුවෙන් ඉටු කල යුතු සියළු කාරණා ඉතාමත් හොඳන් ඉටු කර එතුමා සතුටින් නික්ම යන බවත්,
එතුමා යම් යම් තීන්දු තීරණ ගන්නා විට මන්ත්‍රී මණ්ඩලය ඇතැම් විට එතුමාගේ කාර්යයන් විවේචනය කල බවත්,සේවකයින් බඳවා ගෙන එම කටයුත්ත සිදු කිරීමේදී සභාවේ මුදල් වැටුප් වෙනුවෙන් යොමු කිරීමේදී එය බොරු වැඩක් ලෙස දුටු බවත් මන්ද 2009 සිට වරිපනම් කටයුතු පැවතුනත් මේ වන තෙක් නිමා වී නොතිබීම හේතුවෙන් ඒවා පිළිබඳව කතා කල බවත්,එතුමා අද වන විට සියළු විවේචන වලට පිළිතුරු ලබා දෙමින් සභාවේ සියළු මන්ත්‍රී මණ්ඩලය නිරුත්තර කරමින් සතුටින් නික්ම යන බවත් එබැවින් එතුමා සතුටින් විශ්‍රාම දිවියකට එලඹෙන බවත් ප්‍රකාශ කරන ලදී.සභාපති සුසන්ත හා ලේකම් පෝල් යන දෙදෙනා ඉතාමත් හොඳ සුසංයෝගයක් බවත්, ගරු සභාපතිතුමාගේ තීන්දු තීරණ වලත් අඩු

පාඩු පවසා මෙතැන විවේචනය කරන විට ලේකම් මහතා පණත ගෙන පලාත් පාලන නීතිය තුළ තිබෙන නම්‍යශීලිත්වය තුල නිවැරදි කරන බවත්, එමෙන්ම මන්ත්‍රීවරුන් විසින් ගන්නා තීන්දු තීරණ වලත් හරි මඟ පෙන්වා දෙමින් නිවැරදි කරමින් ගිය ලේකම් මහතෙකු බවත් ප්‍රකාශ කරන ලදී. සහෝදර ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා පැවසූ පරිදි රාජ්‍ය සේවය තුළ නිරත වී සිටින නිලධාරියෙකු ලෙස මෙතුමාගෙන් ලබා ගත යුතු අවවාදාත්මක දේ බොහෝ තිබෙන බවත්,පැය 08කට රාජ්‍ය සේවය සීමා වන බවත්, අප විසින් යම් යම් රාජ්‍ය ආයතන වලට ගොස් එතැන සිටින නිලධාරීන්ව විවේචනය කරන බවත්, මෙම තනතුරේ සිට කරන වැඩ කටයුතු පුද්ගලික කාරණා විවේචනය කරන බවත් නමුත් ලේකම් තුමා විශාල ආදර්ශයක් රාජ්‍ය සේවකයින්ට ලබා දෙමින් නික්ම යන බවත් ,එතුමාගේ සේවා කාලයේ සේවය බිත්ති හතරට මෙම වහලයට සීමා නොකරමින් එම ලේඛණ ගෙදර ගෙනයමින් පවා පෞද්ගලික ජීවිතයද මේ වෙනුවෙන් කැප කර කටයුතු කල බවත්,එය ඉතාමත් හොඳ පුරුද්දක් නමුත් කිරීමට අපහසු බවත් ,එතුමාගේ කතාවේදී අංක එක වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව බවත් අනෙකුත් ප්‍රාදේශීය සභාවට යන විට එය එතැන අංක එක බවත් කියවුන බවත් එලෙස එතුමා සම්පූර්ණයෙන්ම තම දිවිය සේවය වෙනුවෙන් කැප කල බවත් ප්‍රකාශ කරන ලදී.රජයට බර නැති පුරවැසියෙක්,ගත් වැටුපට උපරිම සේවයක් කරමින් එතුමා සතුටින් විශ්‍රාම යන බවත්, එතුමාගේ විශ්‍රාම දිවියට සුභ පතන බවත්,එතුමාගේ දරුවන් යහපත් මාර්ගයේ යමින් එම පවුල් වලට සෞභාග්‍යය ලැබේවායිද ප්‍රාර්ථනා කරන ලදී.මෙතුමා මෙතැනින් ගියද මෙය දමා යාමට එතුමාට නොහැකි බවත්,රාජ්‍ය සේවයේ නිරතවන පිරිසට නිවසට ගොස් සිටීමට නොහැකි බවත් මෙතුමා නැවතත් අප වෙත හැරී බලතැයි පවසමින්ද, අපට අනාගතයේදී එතුමාගේ සහයෝගය අවශ්‍ය වේයැයිද ප්‍රකාශ කරන ලදී.එතුමා වෙන්නප්පුව පුරවරය යන නම වෙනස් කර වයඹ අභිමානය යන තැනට ගෙනා නම රැකගැනීමට එතුමා උත්සුකවේයැයි සිතනා බවත්, එතුමාට සතුටින් යන විශ්‍රාම දිවියේ කටයුතු සාර්ථක වේවායැයිද ප්‍රාර්ථනා කරමින් තම කතාව අවසන් කරන ලදී.

- ගරු මන්ත්‍රීනී එච්.එම්.එස්.බී. කරුණාරත්න මෙනවිය ගරු සභාපතිතුමා ඇතුළු සියළුම දෙනාගෙන් අවසර ගැනීමෙන් පසුව ලේකම්තුමා පිළිබඳව බොහෝ කතා වලට ඇහුම්කන් දුන් බවත් කාල වේලාව ගත වී යන බැවින් පුංචි වචන කීපයක් තමන්ද පැවසීමට කැමති බව ප්‍රකාශ කරන ලදී. ප්‍රාදේශීය සභාව පිළිබඳව කිසිඳු හැඟීමක් දැනීමක් මෙතැනට පැමිණෙන විට තමන්ට නොතිබූන බවත් ඒ පිළිබඳව මින් පෙරද පවසා ඇති බවත්,එසේ පැමිණි තමන්ට නීති දැනුම තිබුණද පලාත් පාලනය පිළිබඳව හා ප්‍රායෝගික දැනුම නොතිබූන බවත් වැඩ කටයුතු කිරීමේදී නිතරම තම දූරකථනය ලේකම් තුමාගේ දූරකථනයට සම්බන්ධ වෙමින් එතුමාගෙන් විශාල ලෙස උපදෙස් ලබා ගැනීමට සිදු වුන බවත්, ඊටත් අමතරව තමන් ඇසූ සෑම දෙයටම පරිනත නිලධාරියෙකු ලෙස එතුමා පැහැදිලි කිරීම් කර දුන් බවත් ප්‍රකාශ කරන ලදී. ඉතාමත්ම සතුටු වන බවත්,පලාත් පාලනයට කුඩා දරුවෙකු වී සිටි තමන්ට එතුමා වැනි කෘතහස්ත නිලධාරියෙකුගෙන් පලාත් පාලනය ඉගෙනීමට ලැබීම තම ජීවිතයේ වාසනාවක්යැයි තමන් සිතනා බවත් ප්‍රකාශ කරනලදී.පලාත් පාලනයේ සෑම අස්සක් මුල්ලක් නෑරම එතුමාට හොඳ අවබෝධයක් තිබූ බවත්,ප්‍රශ්නයක් ඇසූ විට එතුමා එය පැහැදිලි කර ඒ ඔස්සේ සිතීමට ඉඩ සලසා තම වැඩ කටයුතු වලට මෙන් තම නීතිඥවෘත්තියේ වැඩ කටයුතු වලට නොතාරිස් වෘත්තියේ වැඩ කටයුතු වලට එතුමාගේ මඟ පෙන්වීම බොහෝ ඉවහල් වූ බවත් ප්‍රකාශ කරන ලදී.අද දින තමන් දුක් වන බවත් අද දින විපක්ෂයේ අසුන් ගෙන සිටියදී එතුමාගේ සෙවණ අපට ලැබුණ බවත් එබැවින් යම් කිසි ව්‍යාපෘති වැනි දෑ සඳහා මැදිහත් විමට අවස්ථාව නොලැබුණ නිසා එතුමාගෙන් මීටත් වඩා පල ප්‍රයෝජන,දැනුම ගැනීමට අවස්ථාව නොලැබුන බවත් ප්‍රකාශ කරන ලදී. එතුමාට සෑම දෙනාම එතුමාට හොඳ විශ්‍රාම දිවියකට සුභ පැතුම් එක් කල බවත් නමුත් තමන් එතුමාට විශ්‍රාම ලබානොදෙන බවත් වැඩ කටයුතු කර ගෙන යාමේදී එතුමාගේ දූරකථනය නාද වේයැයිද, තවත් පල ප්‍රයෝජන තිබේයැයිද,විශේෂයෙන් නවක මන්ත්‍රීවරුන්ට එතුමාගේ ප්‍රයෝජනය තිබේයැයිද ප්‍රකාශ කරන ලදී.මෙවැනි දැනුම් සම්භාරයක් කතා පවත්වා ගෙදර යවා සමු දීම නවතා එතුමාගේ සේවය සෑම විටම අවශ්‍ය විට සභාවට ලබා ගන්නා ලෙසත්,අවශය සේවාව සම්බන්ධ කරගනිමුයැයිද පවසමින් එතුමාගේ විශ්‍රාම දිවියට සුභ පතමින්ද තම කතාව අවසන් කරන ලදී.

- ගරු මන්ත්‍රී ඩී.නිමල් අරුණ ශාන්ති විජේතුංග මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළුම දෙනාගෙන් අවසර ගැනීමෙන් පසුව ලේකම්තුමා ඉක්මනින් වැඩ කලායැයි පැවසීම සත්‍ය බවත්,එතුමා වේගයෙන් ගමන කරමින් එම වැඩ කටයුතු සියල්ල කල බවත්,එතුමා වයඹ අභිමානය ගෙන ඒමට බොහෝ මහන්සි වී වැඩ කටයුතු කල බව සියළු දෙනා දන්නා බවත් ප්‍රකාශ කරන ලදී.යම් අවස්ථා වලදී එතුමා

මන්ත්‍රීවරුන්ගේ යම් යම් විවේචන වලට මුහුණ දුන්නද එතුමා සිදු කල සෑම දෙයක්ම හොඳ අතට හැරී සියළු දෙයක්ම සාර්ථක වූ බවත්, අප ප්‍රාදේශීය සභාව මුළු ලංකාවම කතා කරන ප්‍රාදේශීය සභාවක් බවට පත් වූ බව එතුමා පැවසූ බවත් එය අප සියළු දෙනාම පිළිගන්නා බවත් ප්‍රකාශ කරන ලදී.එතුමා නිතරම සිනා මුසු මුහුණින් සියළුම මන්ත්‍රීවරුන් සමඟ පක්ෂ විපක්ෂ භේදයක් නොමැතිව කටයුතු කල බවත්, එමෙන්ම online තාක්ෂණය ඔස්සේ කටයුතු කිරීමේදී එම උත්සවය තිබූ දිනට පෙර දින තමන් විදෙස් ගත වී සිටියදී ලේකම් මහතා මෙන්ම හිටපු ලේකම් මහතාද තමාට කතා කර පිටරටකින් ගෙවීමක් අවශ්‍ය බව පවසා එම කටයුත්ත සිදු කරන ලෙස පැවසූ බවත්, තමන්ද එයට එකඟ වී එම කටයුත්ත සිදු කල බවත් ඒ පිළිබඳව මෙතුමාට විශාල උනන්දුවක් තිබූ බවත් එතුමා සෑම විටම අප ප්‍රදේශය වෙනුවෙන් හොඳ වැඩ කොටසක් කිරීමට උත්සාහ කල බවත් ප්‍රකාශ කරන ලදී.බොහෝ මන්ත්‍රීවරුන් මෙතුමාව අද දින ඇගයීමට ලක් කල බැවින් වැඩිදුරටත් මෙතුමාව වර්ණනා නොකරන බවත් පවසමින් මෙතුමාට හොඳ විශ්‍රාම දිවියකට ගොස් සතුටින් තම දරු මුණුබුරන් සමඟ කාලය ගත කිරීමට ලැබේවායැයි ප්‍රාර්ථනා කරන ලදී.එමෙන්ම එතුමා විශ්‍රාම ගියද එතුමාගේ මුහුණින් විශ්‍රාම ගත යුතු වයසක් නොපෙණෙන බවත්,එතුමාගෙන් තරුණ පෙනුමක් දිස් වෙන බවත් පවසමින් සියළුම දෙනාට වාසනාවන්ත ශ්‍රී සුභ නත්තලක්ද,සතුටින් සෞභාග්‍යයෙන් පිරි 2023 වසරක්ද ප්‍රාර්ථනා කරමින් තම කතාව අවසන් කරන ලදී.

- ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළුම දෙනාගෙන් අවසර ගැනීමෙන් පසුව තිස් දෙවසරක පලාත් පාලන සේවය සිදු කර විශ්‍රාම ගන්නා ලේකම් තුමෙනි,පොල් ප්‍රනාන්දු ලේකම් තුමෙනි, මෙම මනුෂ්‍ය ලෝකයට පැමිණි පසුව සෑම මනුෂ්‍යයෙකුටම හොඳක් මෙන්ම නරකක්ද,දක්ෂකම් මෙන්ම අදක්ෂකම්ද,ජීවිතයේ ඉහළටම යා හැකි හා පහළටම වැටෙන තැන්ද තිබෙන බවත් එය ස්වභාවය බවත් ප්‍රකාශ කරන ලදී. වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව ශ්‍රී ලංකා දීපයේ බොහොම පොහොසත් ප්‍රාදේශීය සභාවක් බවත්, මන්ත්‍රී ධූර ලබා සිටින අපට අමතරව,සභාපති ධූර උප සභාපතිධූර ලබා සිටින සියළුම දෙනාට අමතරව මෙහි ලේකම් ධූරය දැරීම ලේකම් මහතාගේ රාජ්‍ය සේවයේදී ලද විශාල භාග්‍යයක් බවත් ප්‍රකාශ කරන ලදී.ලේකම් මහතාගේ සේවයේදී ඉලක්ක කරා යාමට හුරු වූ බව පැවසූ බවත්, ගරු මන්ත්‍රී ඩී.නිමල් අරුණ ශාන්ති විජේතුංග මහතාද ලේකම් මහතා විශ්‍රාම යන වයසක් නොපෙණෙන බව පැවසූ බවත් එය සත්‍ය බවත් සිනාමුසු මුහුණින් සිටින බවත් කෙතරම් බැන්නද එතුමා සිනා සී සිටින බවත්, එයද දෙවියන්වහන්සේගෙ දායාදයක් බවත් ප්‍රකාශ කරන ලදී.''වෙන්පුර'' ලෙස අප මින් පෙර පැවසූ බවත් නමුත් ''වයඹ අභිමානය'' ලෙස පැවසූ විට පුත්තලම් දිස්ත්‍රික්කය මෙන්ම කුරුණෑගල දිස්ත්‍රික්කයද ඒකාබද්ධ බවත් , ''වයඹ අභිමානය'' ගෙන ඒම ලේකම් මහතාගේ දක්ෂකම බවත් ප්‍රකාශ කරන ලදී.අප ප්‍රාදේශීය සභාවේදී ව්‍යවස්ථාපිත ආදායමක් වන බදු ලබා ගැනීම සඳහා හිටපු සභාපති ගරු ට්‍රෙවින් ප්‍රනාන්දු මහතාගේ දෙවනි කාලයේදී 2009දී වර්පනම් දීර්ඝ කිරීමට පණතක් ගෙන එය ගැසට් කිරීමේදී එය යාවත්කාලීන කර සත්‍යක් බවට එය පත් කිරීමට හැකි වූයේ මෙතුමාගේ ලේකම් කාලයේදී බවත් ,ලේකම් මහතා 2019 පැමිණි බවත්,එතුමාට කොවිඩ් කාලය ඉන්ධන ගැටළුව වැනි රාජ්‍ය සේවය අකර්මණ්‍ය වී තිබියදී ලේකම් මහතා උත්සාහයෙන් මෙය ගෙන ගිය බවත්,කාටත් එය අමතක වී තිබූ බවත්, ලංකාව ඉතාමත් අභාග්‍යසම්පන්න කාලයක තිබූ මොහොතක ඉතාමත් ධෛර්ය සම්පන්නව වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමාගේද මන්ත්‍රී මණ්ඩලයේද අවශ්‍යතාවයන් මෙන්ම නිලධාරී මණ්ඩලය හසුරුවාගෙන යාම පිළිබඳ ලේකම් මහතාට ස්තුති කරන බවත් ලැබුණ දේව වරප්‍රසාද වලට ස්තුති කරන බවත් ප්‍රකාශ කරන ලදී. ලේකම් තුමා කොහොම රාජ්‍ය නිලධාරියෙක්ද යන්න මාර්ග ගැසට් එක පිළිබඳව දුටු විට සිතා ගත හැකි බවත්,ගරු සභාපතිතුමා නායකත්වය ගත්තද ලේකම්තුමා නොමැතිව එය සිදු කරගෙන යා නොහැකි බවත් ප්‍රකාශ කරන ලදී.ඕනෑම කෙනෙකුගේ අඩුපාඩු තිබෙන බවත්, ලේකම් මහතාගේ කතාවේදී තමන් සමඟ කටයුතු කල ආකාරය පැවසූ බවත්, තම මන්ත්‍රීධූරය හා සමානව ලේකම් මහතාගේ සේවා කාලය තිබෙන බවත් ලැබුණ අත්දැකීම් සමඟ නිතරම තමන් කතා කල බවත් ප්‍රකාශ කරන ලදී. ලේකම් මහතා නිතරම හරි දේ කිරීමට උත්සාහ කල බවත්, ලේකම් මහතා හැකි ලෙස සෑම දෙයක්ම කිරීමට උත්සාහ කල බවත්,ලේකම් මහතා වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව ලංකාවේ ඉහලම තැනකට ගෙන ඒමට උත්සාහ කල බවත් විශේෂයෙන්ම තාක්ෂණය මුළු ලෝකයම අභිබවාගොස් ඇති අවස්ථාවක තාක්ෂණයෙන් අප ඉතාමත් දුප්පත් වී සිටින මොහොතක එය හොඳ මාවතකට ගෙන ඒමට ලේකම් මහතා ගත් උත්සාහය අගයකරන බවත් ප්‍රකාශ කරන ලදී. සියළු දෙනාටම විශ්‍රාම යාමට සිදු වන බවත්,දැනටත් ඉන්ධන ගැටළුව තිබෙන බවත් මේවා සියල්ලම ගරු සභාපතිතුමා සමඟ එකතු වී ගලපා ගන්නා බවත් ලේකම් මහතා ලබා දුන් ශක්තියට ස්තුතිවන්ත වන බවත් ප්‍රකාශ කරන ලදී.අපව දමා

නොයන ලෙසට ප්‍රාර්ථනා කරන බවත්,ගියත් නැවත පැමිණීමට සිදු වන බවත්,අප අතර ගැටළු තිබෙන්නට ඇතැයිද ඒ සියළුම දේට සමාව හජනය කරමින් ලේකම් මහතාගේ දැනුම හා අත්දැකීම් තුළින් තවත් සේවය කිරීමට වාසනාව ලැබේවායිද, ලේකම් මහතාගේ ප්‍රදේශයට තවත් සේවයක් කිරීමට වාසනාව ලැබේවායි ප්‍රාර්ථනා කරන ලදී.මේ ගත කරන දුක්බර සමය අවසන් වී ශ්‍රි සුභ නත්තනලක්ද ලබන්නාවූ 2023 වසර අභියෝග සියල්ලෙන්ම ඉදිරියට යාමට දේව වරප්‍රසාද ලැබේවායි ප්‍රාර්ථනා කරමින් සුභම සුභ අසිරිමත් වසරක් වේවායැයි පවසමින්ද නැවතත් පෝල් පෙරේරා ලේකම් මහතාගේ ඉදිරි දිවිය තම දරුවන් සමඟ දෙවි මහෝත්තමයාණන් වහන්සේට හා ආදර මැණියන්ට ප්‍රසන්නව යාමට ශක්තිය ධෛර්යය ලැබේවායි පතමින්ද මුළු සභාවට ජේසු පිහිටයි බුදු සරණයි යැයි ප්‍රාර්ථනය කරමින් තම කතාව අවසන් කරන ලදී.

- ගරු උපසභාපති ආර්.ඒ.නිලංක සඳකැල් මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළුම දෙනාගෙන් අවසර ගැනීමෙන් පසුව ලේකම්තුමාගේ අද දින කතාවේදී එතුමා හෘද සාක්ෂියට එකඟව කටයුතු කල පණිවිඩය ලබාදුන් බවත් ,එය එලෙසම නම් එය ගොඩාක් හොඳ බවත් මන්ද අද වන විට රටේ තිබෙන ගැටළුව නම් තම හෘද සාක්ෂියට එකඟව කටයුතු කරන්නේද යන්න බවත් එය මෙම අර්බුද වලට පැමිණීමට හේතුවක් වී ඇති බවත්,විශේෂයෙන්ම දේශපාලනයේ හා පරිපාලන ක්ෂේත්‍රෙය් තිබෙන ගැටළු නිසා වර්තමානයේ සියළු පාලන ව්‍යුහයන් විශාල අප්‍රසාධයකට පත් වී ඇති බවත්,එබැවින් අප රාජකාරී ,අපට පැවරී ඇති වගකීම අප යුතුකම් 75%ක් පමණ හෝ ඉටු කලේ නම් මේ රට මීට වඩා ඉදිරියට යාමට තිබූ බව තමන් සිහිපත් කරන බවත් ප්‍රකාශ කරන ලදී.පාර්ලිමේන්තුවේ සිට අප දක්වාද, ප්‍රාදේශීය සභාවේ සිට ඉහළටම සිටින නිලධාරීන්ද මේ සියළුම දේ සඳහා වගකිවයුතු බවත්,එහිදී ස්වල්ප දෙනෙකු හෝ තම වගකීම් යුතුකම් රට දැය වෙනුවෙන් සිදු කිරීමට උත්සාහ කරන්නට ඇතැයිද ප්‍රකාශ කරන ලදී.මෙතැන හිඳ සිටින සියළුම දෙනාට වගකීමක් පැවරී ඇති බවත් එය ඉටු කිරීම අප යුතුකම බවත්,එසේ නොමැතිව මෙතැනට පැමිණ අප ආර්ථිකය සාදා ගැනීම නැතිනම් පෞර්ෂය සාදා ගැනීම නොව ජනතාව අප කෙරෙහි තැබූ විශ්වාසය අප එලෙසම රැකගෙන ජනතාවට සේවයක් කර ඔවුන් බලාපොරොත්තු වන යුතුකම ඉටු කර අප පෞර්ෂය ගොඩ නගා ගැනිම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී.ලේකම් මහතා තම හෘද සාක්ෂියට එකඟව කටයුතු කල බව දැන ගැනීමට ලැබුණ බවත් එය හොඳ ආදර්ශයක් බවත්,අපත් කෙදිනක හෝ හෘද සාක්ෂියට එකඟව යාමට හැකි නම් ,ජනතාව මෙම ස්ථානයට මේ සියළුම දෙනාව එවුයේ ඔවුගේ දේවල් ඩැහැ ගැනීමට විනාශ කිරීම නොව ඒවා ආරක්ෂා කර දී තවත් ඒවා වැඩි දියුණු කිරීමට බවත් එම රාජකාරීය නිසි ලෙස ඉෂ්ඨ කලේ නම් මරණ මංචකයේදී වුවද යන තැනකට සුව දායකලෙස යාමට හැකි බවත්,එලෙස වැඩ කලහොත් අප නැතත් අප නම කියවෙනු ඇතැයිද, ලේකම් මහතාට එම සතුට ඇතැයි තමන් විශ්වාස කරන බවත් ප්‍රකාශ කරන ලදී.ලේකම් මහතාට සුභ පතන බවත්,වෙන්නප්පුව බල ප්‍රදේශයට එතුමාගෙන් සිදු විය යුතු සියළුම යුතුකම් ඉටු වූ බව අප සියළු දෙනාම දන්නා බවත් එතුමාගේ විශ්‍රාම දිවියෙන් පසුව ඉතාමත් සෞඛ්‍යසම්පන්න දිවියකට සුභ පැතුම් එක් කරන බවත් ලෝකයේ තිබෙන වටිනාම දේ සෞඛ්‍ය බවත් ,ලේකම් මහතාට සුවබර දිවියක් ප්‍රාර්ථනා කරමින් තම කතාව අවසන් කරන ලදී.

- ගරු මන්ත්‍රී එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළු දෙනාගෙන්ම අවසර ගැනීමෙන් පසුව 2022 වසරේ අවසන් මහා සභා රැස්වීමේදී වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා ලෙස කටයුතු කරන ඒ.එෆ්.පෝල් ප්‍රනාන්දු මහතාගේ විශ්‍රාම කටයුත්ත අද දින සිදු වන බවත් ඒ පිළිබඳව වචනයක් පැවසීමට මත්තේන් එතුමාගේ කතාවේදී පැවසූ වැකියක් තමන් නැවත පැවසීමට කැමති බවත්, රාජ්‍ය සේවයේ මා විශ්‍රාම ගියද මා ලබා ගත් දැනුම අවබෝධය කිසිදා විශ්‍රාම නොයන බවද ,ඒ සියල්ල හැකිසෑම විටම ඔබ හා බෙදා ගැනීමට සූදානම් බවද වයඹ අභිමානය සමඟ ඒවා සත්‍ය කල බවට එතුමා වචනයක් පැවසූ බවත් ප්‍රකාශ කරන ලදී.ලේකම්තුමා පිළිබඳව සතුටු වන බවත්,විශේෂයෙන්ම ලේකම්තුමා සතුටින් සිටින බවට තමන් විශ්වාස කරන බවත් ප්‍රකාශ කරන ලදී.මේ සභාවේ 8වන සභාපතිවරයා වන සුසන්ත පෙරේරා මැතිතුමා බවත්,එතුමාගේ කාලයේ මෙම සභාවට පැමිණ එතුමාගේ කාලයේදීම විශ්‍රාම යන බවත් පැවසූ වචනය සතුටින් ගෙදර යනවාය යැයි පැවසූ දෙයට තමන් සතුටු වන බවත් ප්‍රකාශ කරන ලදී.අද දින කමිටු සභාපතිවරුන්,මන්ත්‍රීවරුන්,මන්ත්‍රීවරියන් කතා කල බවත්,ගරු උප සභාපතිතුමාද කලකට පසුව හොඳ වචන ටිකක් මුදා හැරිය බවත් මේ සියල්ල පිළිබඳව සතුටු වන බවත් ,මෙම කාරණාව ගොනු කිරීමට මෙම කාලය ප්‍රමාණවත් නොවන බවත් ප්‍රකාශ කරන ලදී.ලේකම් මහතා පැවසූ ලෙස තමන් ලේකම්තුමාගේ කාමරයට නිතරම පෞද්ගලික ලිපිගොණු සමඟ පැමිණි බවත්,වැඩිම කාරණා ගොනු කීරීම සිදු වූයේ පෞද්ගලික ලිපි ගොණු සමඟ

බවත්, හිටපු ගරු සභාපති ට්‍රෙවින් ප්‍රනාන්දු මහතාගේ කාල සීමාව තුළ සේවයට බඳවා ගත් විමලා නම් සේවක මහත්මිය 8 වන සභාපතිවරයා වන මෙම සභාපතිතුමාගේ කාලය වන තෙක්ද ලේකම්වරුන් කීපදෙනෙකුද කටයුතු කල බවත් ප්‍රකාශ කරන ලදී.ඉතිහාසයේදී සභාපතිවරයා සුළු සේවකයින්ගේ පත්වීමට අත්සන යෙදූ බවත්, නමුත් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් මෑත කාලයේ සිට සභාපතිවරයාගේ අත්සන යෙදූ නෛතික පත්වීම ලිපිය භාර ගැනීම ප්‍රතික්ෂේප කල බවත්,එබැවින් මෙහි සේවය කල ලේකම්වරුන් සොයා යෑමට සිදු වූ බවත්,එලෙස සිල්වා මහතා නම් කලක් මෙහි සේවය කල ලේකම්මහතෙකු සොයා ගිය බවත් එවිට එතුමාට වයස අවුරුදු අසූ ගණන්වල එතුමා පසු වන බවත් එතැන සිට සිසිල් දබරේරා මහතා ,ෂෙල්ටන් පෙරේරා මහතා,තෙරෙස් මහත්මිය මෙලෙස විශ්‍රාමික ලේකම් වරුන් කීපදෙනෙකු වෙතම ලිපි අත්සන් කර ගැනීම සඳහා යොමු කල බවත් ප්‍රකාශ කරන ලදී.මේ සියල්ල නැවතත් මතකයට ගෙන ආවේ ලිපිගොණු යාවත්කාලීන කිරීමට ලේකම් මහතා බොහෝ වෙහස මහන්සි වූ නිසා බැවින්යැයිද, පරණ ගොඩනැගිල්ලේ මුල්ලක තිබූ යම් විට අබලි වී තිබූ සියළු පෞද්ගලික ලිපි ගොණු කරගහගෙන ගෙදර ගෙන ගොස් රෑ එළි වෙන තෙක් වැටුප් වර්ධකයේ සිට මේවා නැවතත් සකස් කර අද දින ලේකම් මහතා විශ්‍රාම යන බවත්,මෙම පෞද්ගලික ලිපි ගොණුව අවසානයේ ඉතිරිවන දෙය බවත් මේවා සම්පූර්ණ කල නිසා ලේකම් මහතාට අනේක වාරයක් පිං ලැබෙන බවත් ප්‍රකාශ කරන ලදී.මෙම ලිපි ගොණුවක් සකස් කිරීමට තිබෙන අමාරුකම තමන් දන්නා බවත්,ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතාගේ සොහොයුරා පසුගිය කාලයේ පරිපාලන නිලධාරීයා ලෙස විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ කටයුතු කල බවත්,එතුමාටද කීප වරක් කතා කල බවත්,තමන්ද විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ගිය බවත් එවිට පවුලේ ඥාතීන්ගේ අත්වාරුවෙන් පැමිණ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ රාජ්‍ය සේවකයින් වැඳ වැටෙන ආකාරය තමන් දුටු බවත් ප්‍රකාශ කරන ලදී.මුමියයන තෙක්ම විශ්‍රාම වැටුප් නොලැබූ පිරිසක් සිටින බවත්, ලේකම් මහතාට පිං රැස් කිරීමට අවශ්‍ය නොවන බවත්,මෙය කිසිවෙකු නොදැක්කාට නොකීවාට මෙය මහා පිනක් බවත් ප්‍රකාශ කරන ලදී. ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතාගේ ඥාතිවරයා වයඹ ධීවර අමාත්‍යාංශයේ ලේකම්තුමා ලෝච් මහතාගේ කාලයේ ලේකම් මහතා පත්වීම ගෙන පැමිණි බවත් ,එවකට ගොඩ්ෆ්‍රි ප්‍රනාන්දු මැතිතුමා වයඹ ධීවර අමාත්‍යවරයා ලෙස කටයුතු කල බවත් , මේ හසල දැනුම කල සේවය මුදලට කිරීමටවත් මැනීමටවත්,කාටවත් ලබා දීමටවත් නොහැකි බවත් ප්‍රකාශ කරන ලදී.එබැවින් ලේකම් මහතා එවැනි කාර්යයක යෙදුන නිලධාරී මහතෙකු කාර්ය මණ්ඩල සාමාජිකයෙකු ලෙස සියළුම දෙනා පිළිගන්නා බවත් මේ කාරණය පිළිබඳ කරුණු කාරණා ගොනු කිරීමට කාලය ප්‍රමාණවත් නොවන බවත් ප්‍රකාශ කරන ලදී. වෙන්නප්පුවේ මිනිසුන් ලෙස ලේකම් මහතා බිංගිරියේ සිට මෙහි පැමිණ වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවට ලබා දුන් සහයෝගයට,කෘතවේදීත්වයට ඉතාමත් කාරුණිකව ස්තුතිවන්ත වන බවත් ප්‍රකාශ කරන ලදී.ලේකම් තුමාට ගෙන යාමට දෙයක් නොමැති බව පැවසූ බවත්,නමුත් මේවා පවසාගෙන යාමේදී තවත් දෙයක් තම මතකයට පැමිණි බවත්,ගරු සභාපතිතුමා හදිසියේ ගැසූ ලියමනකින් ලේකම් මහතාව මුළු දිවයිනටම සාම විනිසුරුවරයෙකු ලෙස පත් කල බවත්, සාමදාන විනිශ්චයවරයෙකු ලෙස ඉතාමත් ආත්ම තෘප්තියකින් යුතුව ලිපියකට අත්සන් යෙදීමට ලේකම් මහතාට හැකි වන බවත් ප්‍රකාශ කරන ලදී.දේවස්ථානයට ලැදි ආගමික කටයුතු සඳහා නිරන්තරයෙන් කටයුතු කරන ලේකම් මහතාට ඒ තුළින්ද පිහිටක් ලැබේයැයිද අවසන් වශයෙන් වෙන්නප්පුවට දුන් සහයෝගය කෘතවේදීව පිළිගත් බවත් ,මන්ත්‍රී ධූරයේ කටයුතු කිරීමේදී යම් යම් වාද විවාද තිබෙන්නට ඇතැයිද ඒ සියළුම දේ ඉතාමත් ඕනෑ කමින් ලේකම් මහතා ඒවා තක්සේරු කරාවියැයි විශ්වාස කරන බවත්,මෙම සේවයට ගෞරවනීය ස්තුතිය පුද කරන බවත් ප්‍රකාශ කරන ලදී.චිරාත් කාලයක් ලේකම් මහතාට නිරෝගී සුවය මෙන්ම දීර්ඝායු ලැබේවායි ප්‍රාර්ථනා කරමින්ද තම කතාව අවසන් කරන ලදී.

ලේකම් මහතා වෙනුවෙන් සැකසූ සිහිවටනය ගරු මහා සභාවේ සියළුම මන්ත්‍රීවරුන්ගේ ආශිර්වාදය මැද ප්‍රධානය කිරීමටත්,එම ප්‍රධානය භාර ගැනීම සඳහා වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ ලේකම් මහතා වන පෝල් ප්‍රනාන්දු මහතාට ආරාධනා කරන බවත් ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

සියළුම ගරු මන්ත්‍රීවරුන්ගේ සහභාගීත්වයේ එම සිහිවටනය ලේකම් මහතාගේ සුරතට භාර දෙන ලදී.

තීරණ අංක 09

ලේකම්තුමාගේ ගුණකථනයන් සාරාංශගත නොකර ලියන බසින් පොත් පිංචක් සකස් කර ලේකම් මහකාට ලබා දෙන ලෙසට ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා විසින් යෝජනා කල අතර

එම යෝජනාව ගරු මන්ත්‍රීනී ආර්.නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය විසින් ස්ථිර කරන ලදී . ඒ අනුව ඒ සඳහා ගරු මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

## 03.යථා පරිදි කල් දී ඇති යෝජනා

### a. ගරු සභාපතිතුමාගේ යෝජනා

i. සේවා ගිවිසුම් කාලය අවසන් වන සේවකයින් 56 දෙනෙකුගේ සේවා ගිවිසුම් කාලය මාස 6කින් දීර්ඝ කිරීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා ගරු මහා සභාවට යෝජනා කරන ලදී.

2022 අගෝස්තු සැප්තැම්බර් මාස වල සේවා කාලය අවසන් වූ පිරිසක් සිටින බවත්,මෙම කණ්ඩායමට පසුගිය මාස 03කදී වැටුප් ගෙවූයේදැයි යන්න දැනගත යුතු බවත්,මෙහි වගකීම සභාවේ නිලධාරීන්ට තිබෙන බවත් ,මෙම සේවා දිගුව ලබා දීමට ප්‍රමාද වීම පිළිබඳව ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා විමසා සිටින ලදී.

මේ පිළිබඳව සභාවේ ගරු මන්ත්‍රීවරුන්ද ප්‍රශ්න කරන ලදී.

මෙය බලා වාර්තාවක් ලබා දෙන ලෙසත්,සංශෝධන තිබේනම් ඒවා සකසා ගනිමුයැයිද ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

තීරණ අංක 10

සේවා ගිවිසුම් පදනම මත සේවයේ යෙදී සිටින පහත නම් සඳහන් සේවක මහත්ම මහත්මීන් 56 දෙනෙකුගේ සේවා කාලය මාස 06කින් දීර්ඝ කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

| අ.අ | නම | තනතුර | ගිවිසුම් කාලය දීර්ඝ කර ගත යුතු කාලය |
|---|---|---|---|
| 01 | ආර්. කුමාර් රගුවන් | සෞඛ්‍ය කම්කරු | 2022.08.25 දින සිට 2023.02.24 |
| 02 | ආර්. කමන් කුෂාන්ත | සෞඛ්‍ය කම්කරු | 2022.08.25 දින සිට 2023.02.24 |
| 03 | ඩබ්.කේ.එම්.එම්.කාංචනා මධුභාෂිනි මෙය | වැඩ කම්කරු | 2022.09.04 දින සිට 2023.03.03 |
| 04 | ඒ.ඒ. විනෝද් මදුරංග සිල්වා මයා | වැඩ කම්කරු | 2022.09.06 දින සිට 2023.03.05 |
| 05 | එස්.ඒ.බී.එස්. නිරෝෂන් අප්පුහාමි මයා | වැඩ කම්කරු | 2022.09.06 දින සිට 2023.03.05 |
| 06 | ඒ.පී.උමේෂ් නිසල් සංකල්ප මයා | වැඩ කම්කරු | 2022.09.06දින සිට 2023.03.05 |
| 07 | ඩබ්.අමිත් මධුසංක පීරිස් | වැඩ කම්කරු | 2022.09.26 දින සිට 2023.03.25 |
| 08 | අයි.ප්‍රසාද් සංජීව සජිත් මයා | සෞඛ්‍ය කම්කරු | 2022.09.26 දින සිට 2023.03.25 |
| 09 | ආර්.ඒ.ගීත් නිර්මාල් මයා | සෞඛ්‍ය කම්කරු | 2022.09.26 දින සිට 2023.03.25 |
| 10 | කේ.ආර්. සුනිල් පෙරේරා මයා | සෞඛ්‍ය කම්කරු | 2022.09.26 දින සිට 2023.03.25 |

| | | | |
|---|---|---|---|
| 11 | ටී.එම්.ඩී. සුදම් පසිඳු පීරිස් මයා | සෞඛ්‍ය කම්කරු | 2022.09.26 දින සිට 2023.03.25 |
| 12 | ආර්.කේ. දිනේෂ් මයා | සෞඛ්‍ය කම්කරු | 2022.09.26 දින සිට 2023.03.25 |
| 13 | ඩී.එම්. වසන්ත දිසානායක මයා | සෞඛ්‍ය කම්කරු | 2022.09.26 දින සිට 2023.03.25 |
| 14 | පී.ඒ. අයේෂා මදුවන්ති පෙරේරා මිය | සෞඛ්‍ය කම්කරු | 2022.09.26 දින සිට 2023.03.25 |
| 15 | සමිත් ධනංජය ප්‍රනාන්දු මයා | සෞඛ්‍ය කම්කරු | 2022.09.26 දින සිට 2023.03.25 |
| 16 | ජේ.ඒ. මිලාන් සන්දීප මයා | වැඩ කම්කරු | 2022.09.26 දින සිට 2023.03.25 |
| 17 | එස්.පී.රුවන් ක්‍රිශාන්ත මයා | රියදුරු | 2022.09.26 දින සිට 2023.03.25 |
| 18 | ඒ.පී.පී. දර්ශන ජයලාල් මයා | රියදුරු | 2022.09.28 දින සිට 2023.03.27 |
| 19 | ඩී.ඒ. සනත් ඉංදික මයා | රියදුරු | 2022.09.28 දින සිට 2023.03.27 |
| 20 | ආර්.එස්. දුෂ්ෂන්ත ප්‍රනාන්දු මයා | රියදුරු | 2022.09.28 දින සිට 2023.03.27 |
| 21 | ජේ.ඒ. සංජීව පද්මසිරි මයා | රියදුරු | 2022.09.28 දින සිට 2023.03.27 |
| 22 | බී.කේ. තුෂාන් මංජුල මයා | රියදුරු | 2022.09.28 දින සිට 2023.03.27 |
| 23 | යු. සුලානි මහේෂිකා ප්‍රනාන්දු මිය | පුස්තකාල සහයක (කම්මල්පත්තුව පුස්තකාලය) | 2022.12.30 දින සිට 2023.06.29 |
| 24 | කේ. අෂේනි ප්‍රිසන්කි ප්‍රනාන්දු මෙය | පුස්තකාල සහයක (ලුණුවිල පුස්තකාලය) | 2022.12.30 දින සිට 2023.06.29 |
| 25 | යු.ඒ. ෂෙහාරා මධුෂානි මෙය | පුස්තකාල සහයක කහටවිල | 2022.12.30 දින සිට 2023.06.29 |
| 26 | එස්.එම්.සී.එන්.සිත්මි පෙරේරා මෙය | ආයුර්වේද සහයක (ප්‍රධාන කාර්යාලය) | 2023.01.19 දින සිට 2023.07.18 |
| 27 | බී. මදූෂා ලක්මිණි මෙය | පුස්තකාල සහයක මහයායවත්ත | 2022.12.30 දින සිට 2023.06..29 |
| 28 | දසුනි අගලියවන්න | පුස්තකාල සහයක (බූජ්ජම්පල පුස්තකාලය) | 2022.12.30 දින සිට 2023.06.29 |
| 29 | ඕවිටිගලගේ භාග්‍යා ලක්මිණි මෙය | පුස්තකාල සහයක (වෙන්නප්පුව පුස්තකාලය) | 2023.01.04 දින සිට 2023.07.03 |

| | | | |
|---|---|---|---|
| 30 | ජේ.අයි.රවිඳු තාරක මයා | පුස්තකාල සහයක (කම්මල්පත්තුව පුස්තකාලය) | 2023.01.04 දින සිට 2023.07.03 |
| 31 | ඩබ්.ඒ.අයි. කල්පනී විජේසිංහ මෙය | පෙර පාසල් සහයිකා (කිරිමැටියාන නෙළුම්වැව) | 2023.01.22 දින සිට 2023.07.21 |
| 32 | එස්.එම්. යමුනා ලක්මාලි මෙය | පෙර පාසල් සහයිකා (මැටිකොටුව පෙර පාසල) | 2023.01.22 දින සිට 2023.07.21 |
| 33 | ඩී.එච්.ඒ.ඩී.නිමේෂා මධුෂානි වීරසිංහ මෙය | පෙර පාසල් සහයිකා දංකොටුව පෙර පාසල | 2023.01.22 දින සිට 2023.07.21 |
| 34 | ඩබ්.ආර්. සෙව්වන්දි තිසේරා මෙය | කාර්යාල කාර්යය සහයක (ප්‍රජා සංවර්ධන අංශය) | 2023.01.22 දින සිට 2023.07.21 |
| 35 | ඩබ්.ඒ.එස්.රසාරා ජාන්ස මෙය | කාර්යාල කාර්යය සහයක (කර්මාන්ත අංශය) | 2023.01.22 දින සිට 2023.07.21 |
| 36 | ඩබ්.ඒ. ලහිරු සාගර මයා | රියදුරු (වෙන්නප්පුව සෞඛ්‍ය) | 2023.01.28 දින සිට 2023.07.27 |
| 37 | ඩබ්.පි. ලලිත් සංජීව මයා | මුරකරු දංකොටුව | 2023.01.05 දින සිට 2023.07.04 |
| 38 | ජේ.පි.රුවන් කුමාර මයා | වැඩ කම්කරු | 2022.12.30 දින සිට 2023.06.30 |
| 39 | ඩබ්.එනක්ෂි ජයාෂා වාස් මෙය | වැඩ කම්කරු (ඇල්බට් ක්‍රීඩාංගණය) | 2023.01.26 දින සිට 2023.07.25 |
| 40 | එච්.ඩී. මධුකා දේශානි මෙය | වැඩ කම්කරු (පෙරටු කාර්යාලය) | 2022.12.30 දින සිට 2023.06.29 |
| 41 | එම්.නිපුනි අයේෂා ප්‍රනාන්දු මෙය | වැඩ කම්කරු (වරිපනම් ඒකක යාවත්කාලීන කිරීම) | 2022.12.30 දින සිට 2023.06.29 |

| | | | |
|---|---|---|---|
| 42 | පී.කේ. සමාධි අනුරුද්ධිකා මිය | වැඩ කම්කරු (වරිපනම් ඒකක යාවත්කාලීන කිරීම) | 2022.12..30 දින සිට 2023.06.29 |
| 43 | එම්.එම්.උදයකුමාර මයා | වැඩ කම්කරු (වරිපනම් ඒකක යාවත්කාලීන කිරීම) | 2022.12.30 දින සිට 2023.06.29 |
| 44 | ටී.එම්.ඩී. සයනා දුල්ෂාරා | වැඩ කම්කරු (වරිපනම් ඒකක යාවත්කාලීන කිරීම) | 2022.12.30 දින සිට 2023.06.29 |
| 45 | ආර්.ඒ. පුෂ්ප කුමාර මයා | වැඩ කම්කරු (වරිපනම් ඒකක යාවත්කාලීන කිරීම) | 2022.12.30 දින සිට 2023.06.29 |
| 46 | කේ.ජේ.පී.එස්. සුරේනි ප්‍රනාන්දු මිය | වැඩ කම්කරු (වරිපනම් ඒකක යාවත්කාලීන කිරීම) | 2022.12.30 දින සිට 2023.06.29 |
| 47 | යු. අශාන් දුලන්ගික මයා | වැඩ කම්කරු (වරිපනම් ඒකක යාවත්කාලීන කිරීම) | 2022.12.30 දින සිට 2023.06.29 |
| 48 | එස්.ජී.එම්.ප්‍රසාදි වාසනා මෙය | වැඩ කම්කරු (වරිපනම් ඒකක යාවත්කාලීන කිරීම) | 2022.12.30 දින සිට 2023.06.29 |
| 49 | එම්.නිපුනි උදේශිකා ප්‍රනාන්දු මෙය | වැඩ කම්කරු (වරිපනම් ඒකක යාවත්කාලීන කිරීම) | 2022.12.30 දින සිට 2023.06.29 |
| 50 | යු.රොෂාන් නතාල් ප්‍රනාන්දු මයා | වැඩ කම්කරු (වරිපනම් ඒකක යාවත්කාලීන කිරීම) | 2022.12.30 දින සිට 2023.06.29 |
| 51 | එම්.පී. අමිල කුමාර මයා | සෞඛ්‍ය කම්කරු | 2022.11.02 දින සිට 2023.05.03 |
| 52 | එල්. නිරෝෂිනි කාංචනා මිය | පුස්තකාල සහයක | 2022.11.28 දින සිට 2023.05.27 |
| 53 | ජී.හිරුණි රංජලා මෙය | පුස්තකාල සහයක | 2022.11.28 දින සිට |

| | | | |
|---|---|---|---|
| | | | 2023.05.27 |
| 54 | එම්.ශ්‍යාමල් අකලංක ප්‍රනාන්දු මයා | පුස්තකාල සහයක | 2022.11.28 දින සිට 2023.05.27 |
| 55 | ආර්.ඉෂානි ශශිකලා ප්‍රනාන්දු මෙය | පුස්තකාල සහයක | 2022.11.28 දින සිට 2023.05.27 |
| 56 | ඩබ්.ඒ.රොෂාන් ප්‍රියදර්ශන මයා | මුරකරු | 2022.11.29 දින සිට 2023.05.28 |

ii. සභාවේ කර්මාන්තයන් සිදු කිරීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් ගරු මහා සභාවට යෝජනා කරන ලදී.

තීරණ අංක 11

සභාවේ පහත සඳහන් කර්මාන්තයන් ඉටු කිරීම සඳහා මහා සභාවේ අනුමැතිය අවශ්‍ය බැවින් ඒ සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා ගරු මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

- උදාසිරිගම-ලුණුවිල කටහගහවත්ත අතුරු මාර්ගය බොරළු දමා සංවර්ධනය කිරීම
- බ/ලුණුවිල පහලවත්ත පාර තාර යොදා කඩතොළු අළුත්වැඩියා කිරීම
- සෙන්දිරියාමුල්ල බුලන පාර ප්‍රවේශ මාර්ගය අළුත්වැඩියා කිරීම
- සිංගක්කුලිය-සෙන්දිරියාමුල්ල ඇටඹගහ පාර ප්‍රවේශ මාර්ගය සඳහා දෙවන වර තාර අතුරා අළුත්වැඩියා කිරීම

**b. ගරු මන්ත්‍රී යෝජනා**

(i). ද/දූම්මලදෙණිය සුනාමි ජනපදයේ හිස්ව පවතින බිම් තීරය සභාවට පවරාගෙන නිවාස 25ක් ඉදි කර කුලී පදනම මත ලබා දීම සුදුසු බවට ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතා විසින් ඉදිරිපත් කර ඇති යෝජනාව ගරු මහා සභාවට යොමු කරන ලදී.

එම භූමිය රජයට අයිතිදැයි ගරු සභාපතිතුමා විසින් විමසා සිටින ලදී.

මෙය සුනාමි ජනපදය සෑදීමට පියතුමෙකු විසින් ගත් ඉඩමක් බවත්, ඉතිරි ප්‍රමාණය කැලය වැවී ඇති බවත් ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතා විසින් පවසා සිටින ලදී.එම පියතුමා මෙ වන විට නොමැති බවත්,ලියකියවිලිද නොමැති බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

මින් පෙර ද මේ සඳහා යම් ගැටළුවක් පැමිණි බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

එය වෙනත් ගැටළුවක් බවත්, මෙය විශාල බිම් ප්‍රමාණයක් බවත්,පළමුව මෙය මැන සභාවට පවරා ගනිමුයැයිද ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතා ප්‍රකාශ කරන ලදී.

පළමුව මෙය මැන සිටිමුයැයි ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

මෙහි නීතිමය තත්ත්වය පරීක්ෂා කර බැලිය යුතු බව ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

මෙය බලා වාර්තාවක් ලබාගෙන ඊළඟ මහා සභාවට දමමුයැයි ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

තීරණ අංක 12

මේ පිළිබඳව සම්පූර්ණ වාර්තාවක් ගෙන ඊළඟ මහා සභාවට යොමු කිරීම සුදුසු බවට තීරණය කරන ලදී.

## 05. කාරක සහා වාර්තා සලකා බැලීම.

i. 2022-11-04 , 2022-11-10 , 2022-11-18 හා 2022-12-02 වන දින වල පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සහා වාර්තා සලකා බැලීම.

ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව 2022-11-10 වන දින වාර්තාවේ අවසන් පිටුවේ“නව කොම්පෝස්ට් අංගණයේ වහලය ඉදි කිරීම් වැඩ ඇස්තමේන්තු ප්‍රකාරව නිම කර 2022-දෙසැම්බර් 20 දිනට පෙර සභාව වෙත බාරදිය යුතු බව“ ලෙස සඳහන් වන බවත්,මේ වන විට වැඩ ආරම්භ කර තිබේදැයි යන්න විමසා සිටින ලදී.

ආරම්භ කර ඇති බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

කොම්පෝස්ට් නිෂ්පාදනයට බලපාන කැබලි කරන යන්ත්‍රයේ මෝටරය නොමැති බවත්,එම මෝටරය ඉක්මනින් ලබා ගන්නා ලෙස ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

| |
|---|
| තීරණ අංක 13 |
| 2022-11-04 , 2022-11-10 , 2022-11-18 හා 2022-12-02 වන දින වල පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සහා වාර්තා සත්‍ය වාර්තා බව ගරු මන්ත්‍රීනී ජේ.කේ.දීපා මේරි අයිරංගනී පෙරේරා මහත්මියගේ හා ගරු මන්ත්‍රීනී ජී.ලීනා ප්‍රියංගිකා මහත්මියගේ යෝජනා ස්ථිරත්වයෙන් සහා සම්මත විය. ඒ අනුව එම වාර්තාවේ සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා මහා සභාවේ ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී. |

ii. 2022-11-18 වන දින පැවති මාර්ග,ඉඩම්,ගොඩනැඟිලි හා කාර්මික සේවා කාරක සහා වාර්තාව සලකා බැලීම.

| |
|---|
| තීරණ අංක 14 |
| 2022-11-18 වන දින පැවති මාර්ග,ඉඩම්,ගොඩනැඟිලි හා කාර්මික සේවා කාරක සහා වාර්තාව සත්‍ය වාර්තාවක් බව ගරු මන්ත්‍රී යූ.ජුඩ් එම්මානුවෙල් මහතාගේ හා ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සහා සම්මත විය. ඒ අනුව එම වාර්තාවල සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා මහා සභාවේ ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී. |

iii. 2022-11-29 වන දින පැවති ප්‍රජා සංවර්ධන කාරක සහා වාර්තාව සලකා බැලීම

| |
|---|
| තීරණ අංක 15 |
| 2022-11-29 වන දින පැවති ප්‍රජා සංවර්ධන කාරක සහා වාර්තාව සත්‍ය වාර්තාවක් බව ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතාගේ හා ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සහා සම්මත විය. ඒ අනුව එම වාර්තාවේ සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා මහා සභාවේ ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී. |

iv. 2022-10-21 වන දින පැවති පොදු පහසුකම් හා ආපදා කළමනාකරණ කාරක සහා වාර්තාව සලකා බැලීම

මෙම වාර්තාව පසුගිය මස මහා සභාවට ඉදිරිපත් නොකල බව ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.එය හිතාමතා සිදු කලේ යැයි තමන් සිතනා බවත්,මන්ද ඉන් පසු දිනවල පැවති අනෙක් කමිටු වාර්තා සභාගත කල බවත් ප්‍රකාශ කරන ලදී.මෙවර වාර්තාව එවූවද මෙම වාර්තාවද වැරදි බවත්,ඉදිරිපස තිබෙන නාම පුවරුවක් සම්බන්ධයෙන් එදින සාකච්ඡා කල බවත්,එවිට එය අනවසර නාමපුවරුවක් බවත් ඊළඟ කමිටුවට පෙර ඉවත් කිරීමට කටයුතු කරන බවට ආදායම් පරීක්ෂකතුමාද භාරගත් බවත් නමුත් එසේ සිදු නොවූ බවත් එබැවින් තමන් පසුගිය කමිටුවට සහභාගී නොවූ බවත් කමිටුවල ගන්නා තීරණ කමිටුවලට පමණක් සීමා වී ඇ.ති බව තවදුරටත් ප්‍රකාශ කරන ලදී. එම ආදායම් පරීක්ෂක මහතා මේ සඳහා රු.8000ක ගාස්තුවක් අය කර ඇති බව පවසා තිබූ බවත්,නමුත් ඊට පෙරදී මේ පිලිබඳව නොපැවසුව බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී. එම මුදල ලබා ගත්තේ නම් කමිටුවට පැමිණ නාම පුවරුව ඉවත් කරන බවට ආදායම් පරීක්ෂක මහාත පැවසුවේ කෙසේදැයිද විමසා සිටින ලදී.

එම රුවන් නම් ආදායම් පරීක්ෂක මහතා මේ වසරේ මෙහි සේවයට පැමිණි බවත්,මින් පෙර රවීන්ද්‍ර මහතා වෙන්නප්පුව ප්‍රදේශයේ සිටි බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

එම කඩහිමියා අසල රිසිට්පත් තිබෙන බව ගරු මන්ත්‍රීනී ජේ.කේ.දීපා මේරි අයිරංගනී පෙරේරා මහත්මිය ප්‍රකාශ කරන ලදී.

මෙම ආදායම් පරීක්ෂක මහතා කමිටුවේදී මෙය ඉවත් කරන බව පැවසූ බවත්,එසේ නම් හොරෙන් ඒ සඳහා මුදල් ගෙන ඇති බවත් වරදක් කර ඇති බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

එය සොයා බලා කටයුතු කරන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මේවා සම්බන්ධයෙන් කටයුතු කරන ලෙසත්,අනෙක් සැමටම වඩා කමිටු වලට තමන් සහභාගී වූ බවත්, නමුත් මේ වන විට සමහර කමිටු තීරණ කාගේ හෝ බලපෑම් මත කමිටුවෙන් ඉවතට යන බව මේ වන විට හැඟී ඇති බවත්,යම් විට කමිටු වාර්තාවලට ද නොපැමිනෙන බවත්,කාලය ශ්‍රමය වැය කර කමිටුවලට පැමිණ ගන්නාවූ තීන්දු තීරණ වලින් පලක් නොවන බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතා මේ පිළිබඳව විමසීමක් කල බවත්,එම කඩහිමියාව ගෙන්වූ බවත් මෙහිදී පවසා සිටින ලදී. එම පුද්ගලයා මින් පෙර වසර වලදී ගෙවූ රිසිට් ප්‍රධාන කාර්යාලයේ තිබෙන බවත්,මේ වසරේ රිසිට්පත් මෙහි තිබෙන බවත් පැවසූ බව ප්‍රකාශ කරන ලදී.මෙමෙ වෙලඳසැල ඉවත් කරගන්නා බව ඔවුන් පැවසූ බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

වයඹ අභිමානයට එලෙස ව්‍යාපාරිකයෙකුට තර්ජනය කල හැකි දැයි ගරු මන්ත්‍රී ඒ.රෙක්ෂි ප්‍රභාත් ප්‍රනාන්දු මහතා විමසා සිටින ලදී.

යම් විට සභාවට ලැබෙන දෙයක් තිබේනම් එය වැළකීමට නොයන බව ගරුසභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

තීරණ අංක 16

2022-10-21 වන දින පැවති පොදු පහසුකම් හා ආපදා කළමනාකරණ කාරක සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බව ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතාගේ හා ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය. ඒ අනුව එම වාර්තාවේ සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

v. 2022-11-24 වන දින පැවති පරිසර සහ මහජන සෞඛ්‍ය පහසුකම් සංවර්ධන කාරක සභා වාර්තාව සලකා බැලීම

පරිසර බලපත්‍රයක් ලබානොගෙන අප කැඳවීමක් නොකල කොහු කර්මාන්ත ශාලාවක් සම්බන්ධයෙන් මෙම කමිටුවේදී සාකච්ඡා වූ බව ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුන්, නිලධාරීන් හා පොලිස් නිලධාරීන්ද එදින සිටි බවත්,කමිටුව මඟින් මෙම කර්මාන්තය තාවකාලිකව නවතා ගෙන්වා විසඳුමක් ලබා ගැනීමට තීරණය කල බවත් නමුත් ලිපි ගොස් මේ පිළිබඳව දැනුම් දුන්නද එම පුද්ගලයා සභාපතිතුමා සමඟ සාකච්ඡා කර බේරා ගන්නා බව පවසා තිබූ බවත්, තවමත් එය සිදු කරගෙනයන බවත් ප්‍රකාශ කරන ලදී.මේ සඳහා පරිසර කමිටුව මඟින් තීරණයක් ගත්තේ මේ සඳහා විශාල පිරිසක් විසින් අත්සන් කර ලිපි එවා තිබූ නිසා බවත්,ජල දූෂණය පරිසර දූෂණය වී ගොස් ඇති බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

කොහු මෝල් හිමියන් 20 දෙනෙකු පමණ තමන් හමු වීමට ඊයේ දින පැමිණි බවත්,2021 මැයි මස පළමුව ගැටළුව මතු වීමේදී නර්ඩ් ආයතනයට මෙය භාරදුන් බවත්, නමුත් මෙම පුද්ගලයා මේ පිළිබඳ තැකීමක් නොකර කටයුතු කර ඇති බවත්,ව්‍යාපාර පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය කටයුතු සකස් කර ගන්නා තෙක් කොවිඩ් සමයේ ව්‍යාපාර නැවතීම වලක්වාලීමට තාවකාලික බලපත්‍රයක් 2022දී ලබා දී ඇති බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. එයත් සමඟ මෙය සිදු කරගෙන ගිය බවත්,නැවතත් ගැටළුවක් මතු වීමේදී මෙය නවතා දමන බවත්,පොලිසිය මඟින් තවමත් ලිපියක් ගොස් නැති බවත්,එම නිලධාරීතුමිය අසනීප වී සතියක් රාජකාරියට වාර්තා නොකල බැවින් පෙරේදා දින තමන් අසලට ලිපියක් පැමිණි බවත්,ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදු කර ක්ෂණිකව මේ පිළිබඳව කටයුතු කරන ලෙස තමන් නර්ඩ් ආයතනයට ලිපියක් යොමු කල බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

නර්ඩ් ආයතනයට කතා කිරීමට ගරු සභාපතිතුමා අවශ්‍ය නොවන බවත්,එය ව්‍යාපාරහිමියා දැනගත යුතු බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.එම ව්‍යාපාර හිමියා කිසිඳු සහයෝගයක් නොමැතිව,තර්ජනාත්මකව සිදු කරගෙන යන බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.මේ සඳහා කමිටුවද, නිලධාරින්ද එකඟබවත් නමුත් ගන්නා තීරණ ක්‍රියාත්මක නොවන බවත්,හැකි තරම් සාධාරණව මෙම ගැටළුව විසඳා ගැනීමට උත්සාහ කරන බැවින් එක් පාර්ශවයකගේ පසින් නොසිට කටයුතු කරන ලෙසත් ප්‍රකාශ කරන ලදී.

මෙය වසර ගණනාවක සිට තිබෙන ගැටළුවක් බවත්,ව්‍යාපාරයක් කිරීමට සුදුසු ස්ථානයක් නොවන බවත්,සැම දෙනාම මේ සඳහා විරුද්ධ බවත් ගරු මන්ත්‍රී කේ.එල්.චමින්ද කුමාර කරුණානායක මහතා ප්‍රකාශ කරන ලදී.නර්ඩ් ආයතනය සම්බන්ධයෙන්ද ගැටළුවක් තිබෙන බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

කහටවිල බ්ලොක්ගල් වැඩපල සම්බන්ධයෙන් නර්ඩ් එකේ වාර්තාවද අසත්‍ය වාර්තාවක් බව ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

ව්‍යාපාර සඳහා විරුද්ධ නොවන බවත්,මේවා සඳහා කැඩූ ඉඩම් වල සභාව සතු කොටස් වල හෝ බදු ලබා දී ඒවා ස්ථානගත කරන ලෙසත් ගරු මන්ත්‍රී කේ.එල්.චමින්ද කුමාර කරුණානායක මහතා ප්‍රකාශ කරන ලදී.

නර්ඩ් එකට තමන් කතා නොකර නොපැමිණෙන බැවින් මෙම කටයුත්ත කර දෙන ලෙසට තමන් කතා කල බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

දන්කොටුව නගරයේ වෙලඳ සංකීර්ණයේ වැසිකිලි පද්ධතිය මේ වන විට දුර්ගන්ධයට පත් වී ඇති බවත්, මේ පිළිබඳව සොයා බලා කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.එමෙන්ම පොදු පහසුකම් කමිටුව පිළිබඳවද කතා කල යුතු බවත් විදුලි බල්බයක් සාදා ගැනීමට මාසයක් බලා සිටිය යුතු බවත්,අඩුම තරමින් දිනයට එන විට බල්බ 50-60ක් හෝ එවන ලෙසටද ඉල්ලා සිටින ලදී.

ඊයේ දිනයේදී ත්‍රීවිල් රථය අළුත්වැඩියා කර ගෙනා බවත්,ඒ අනුව දින 15 වරක් බල්බ සෑදීමට එවීමට ඉදිරියේදී කටයුත කරන බවත්, බල්බ ගැනීමට වැය ශීර්ෂයේ මුදල් නොමැති බවත් එබැවින් බල්බ 1000 ගෙනැවිත් මෙම කටයුතු කරගෙන යන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

අනවශ්‍ය වියදම් නතර කර මෙය සිදු කරන ලෙස ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

බීගන් බල්බ නොමැතිදැයි ගරු මන්ත්‍රී ඩබ්.ඒ .ගොයාභය වික්‍රමසිංහ මහතා විමසා සිටින ලදී.
වසර දෙකක වගකීම තිබෙන බැවින් බීගන් බල්බ රිටර්න් යැවූ බවත්, නමුත් මේ වන විට එම බල්බය ගැනීමට නොමැති බව පවසා වෙනත් බල්බයක් ගෙනැවිත් එකවර බල්බ 100ක් ගන්නා ලෙසට පවසන බවත් ,ඒ සඳහා ලක්ෂ 5ක් වැය වන බවත්,නමුත් වැය ශීර්ෂය තුළ එවැනි මුදලක් නොමැති බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මාරු කරන්නට යැවූ බල්බ බොහෝ විට නැවත පැමිණ නොමැති බවත්,පාස්කු ප්‍රාහරටයන් පසුව ගත් බල්බය මාස දෙක තුනෙන් පිච්චී ගිය බවත්,නමුත් ඒවාට රිටර්න් බල් බ නොලැබුණ බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

එ් පිළිබඳව තමන් බලන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.ත්‍රීවිල් එක මඟින් පිච්චෙන බල්බ ගලවා එවා ගෙන ගොස් මාරු කර දෙන බවත්,ජනවාරි මාසයේදී රු.7000ක් පමණ වන බල්බය ගන්නේද නැද්ද යන්න තීරණය කල යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

බීගන් ලයිට් එක වෙනුවටදැමූ ලයිට් එක දමමුයැයිද ඒ සඳහා විදුලියද අවමයෙන් වැය වන බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

මෙම විදුලි බල්බයේ කුඩා සර්කිට් එකක් පිච්චී යන බවත්,එය සකස් කරන සේවකයෙකු ගත් විට සභාවටම එය සිදු කර ගත හැකි බවත්,වියදම අඩු කර ගත හැකි බවත් ගරු මන්ත්‍රී කේ.එල්.චමින්ද කුමාර කරුණානායක මහතා ප්‍රකාශ කරන ලදී.

මෙම කතාව තමන්ටද ආරන්චි වූ බවත්,ඒ පිලිබඳව අවධානය යොමු කරන බවත් ප්‍රකාශ කරන ලදී.

දන්කොටුව සතිපොලේ අඩුපාඩු රැසක් තිබෙන බවත්, බිම කැඩී ඇති බවත් කරවල වීදිය ලුණුවලට කණු දිරාගෙන යන බවත්,ඒ සඳහා යකඩ බටය මැදි වීමට කොන්ක්‍රීට් වලින් තට්ටුවක් ගැසීමට සිදු වන බවත්, තාර ගැලවී ඇති බවත්,පොලේ අයිනට කුණු ගෙනැවිත් දමන බවත් ඒවා පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරන ලෙසත් ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

ඒ පිළිබඳව සොයා බලන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.එමෙන්ම සභාව ට්‍රැක්ටර් රථ 06ක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගෙන තිබෙන බවත්, විවිධ කරුණු කාරණා වලට ඒවා ලබා ගෙන තිබෙන බවත්,මහා සභාවේදී තීරණයක් මේ සඳහා ගනිමුයැයිද මෙම ට්‍රැක්ටර් රථ කිසි දිනක බැහැර නොදීමට තීරණය කරමුයැයිද ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.මෙම ට්‍රැක්ටර් රථ සේවාව කරගෙන යාමට අවශ්‍ය බවත් කෙදිනකවත් මෙම ට්‍රැක්ටර් රථ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට නොදීමට තිරණයක් ගනිමුයැයිද ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙම ට්‍රැක්ටර් රථ වල වාර්ෂික රක්ෂණය ආදායම් බල පත්‍ර ගන්නේ කවුරුන්දැයිද ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා විමසා සිටින ලදී.

සභාව මඟින් එම කටයුතු සිදු කරන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

අපේ නමින් ඒවා ලබා ගන්නේදැයි ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා විමසා සිටින ලදී.

ඒවා ආපදා එකේ නමින් යන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ඒවාට වියදම් කරනුයේ අපදැයි ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා විමසා සිටින ලදී.

මෙය යහපාලන ආණ්ඩුව මඟින් ප්‍රාදේශීය සභාවට ලබා දුන් බවත්,මෙම ට්‍රැක්ටර් රථ ප්‍රයෝජනයක් නොකර අබාවයට ගිය බවත් ,සෑම දාම මේ පිළිබඳව රැස්වීම් වල කතා කර මෙම ට්‍රැක්ටර් රථ 6 තමන් ලබා ගත් බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙම ට්‍රැක්ටර් රථ ප්‍රා දේශීය ලේකම් ගත්තද පලක් නොවන බවත්,ලබා ගැනීමට පදනමක් තිබිය යුතු බවත්, කසල හෝ ජලය ප්‍රවාහනය කිරීමක් එම ආයතන වල සිදු නොවන බවත්,එබැවින් සභාව මඟින් ට්‍රැක්ටර් රථ මිල දීගන්නා තාක් මෙය සභාවේ තබා ගැනීමට තීරණයක් ගනිමුයැයි ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.
එය සභාවට අවාසියක් සිදුවේයැයිද මේ මොහොතේ මිලදී ගන්නා ලෙස පැවසුවහොත් කුමක් කරන්නේදැයිද ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මේ සඳහා කම්පැක්ටර් දෙකක් ගත්තේනම් විශාල කුණු ප්‍රමාණයක් එකවර ගෙන ගිය හැකි බව ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.
මේ සඳහා දැනටත් විසඳුමක් තිබෙන බවත්,දකුණු පලාතේ සභාවකට අවශ්‍ය වන්නේ ට්‍රැක්ටර් රථ දෙකක් බවත්,එම ආයතනයට ලොකු කම්පැක්ටරයක් ලබා දී ඇති බවත් එම සභාපතිතුමා සාක්ච්ඡාවකදී එය හුවමාරු කර ගැනීමට කැමති බව පැවසූ බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙම ට්‍රැක්ටර් රථ 6 අයිතිකරු කවුරුන්ද යන්න ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා විමසා සිටින ලදී. එමෙන්ම මෙම ට්‍රැක්ටර් අයිති වන ආයතනයෙන් අවශ්‍යතාවය පෙන්වා දී මෙවා සභාවට පවරා දෙන ලෙසට ඉල්ලීමක් කරමුයැයිද තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

සභාව තුලින් නික්මගිය ගමන් ඒවා නැවත ලබා ගන්නා බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

අදාල අයිතිකරුගෙන් මෙම ට්‍රැක්ටර් රථඉල්ලා ගනිමුයැයි තමන් යෝජනාවක් ගෙන එන බවත් ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

තීරණ අංක 17

2022-11-24 වන දින පැවති පරිසර සහ මහජන සෞඛ්‍ය පහසුකම් සංවර්ධන කාරක සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බව ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතාගේ හා ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය. ඒ අනුව එම වාර්තාවේ සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

තීරණ අංක 18

සභාවේ දැනට පවතින ට්‍රැක්ටර් රථ 06 සභාවට පවරා දෙන ලෙසට එම ටැක්ටර් රථ ආයතනයෙන් ඉල්ලීමක් කිරීම සුදුසු බවට ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා විසින් ගෙන ආ යෝජනාව ගරු මහා සභාව විසින් ඒකමතිකව අනුමත කරන ලදී.

## 06.ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ එකතු කල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සළකා බැලීම.

**i. මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය -2022 ඔක්තෝබර්**

**ii. මාසික ඒකාබද්ධ ගෙවීම් සාරාංශය -2022 ඔක්තෝබර්**

තීරණ අංක 19

2022 ඔක්තෝබර් මස මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය සහ මාසික ඒකාබද්ධ ගෙවීම් සාරාංශය සත්‍ය වාර්තා බව ගරු සභාපතිතුමා යෝජනා කල අතර ගරු මන්ත්‍රී ඒ.එස්.එම් කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා ගරු මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

iii. 2022 නොවැම්බර් මස ඉන්ධන හා අළුත්වැඩියා වෙනුවෙන් වියදම් වූ වාර්තාව සලකා බලන ලදී.

iv. 2022 වර්ෂයේ නොවැම්බර් මස වීථි පහන් නඩත්තු කිරීම පිළිබඳ ප්‍රගති වාර්තාව සලකා බලන ලදී.

## 07. වෙනත් කරුණු ඉදිරිපත් කිරීම.

(i). ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව මැදිකැලේ තාප්පය සම්බන්ධ ගැටළුවට කුමක් සිදු වන්නේදැයි විමසා සිටින ලදී.

මෙහි අයිතිකරුවන්ව ගෙන්වා සාකච්ඡා කල බවත්,එම කම්බි වැටවල් ඉවත් කිරීමට සතියක කාලයක් ඉල්ලූ බවත්, බඳු දීම මහා සභාවෙන් ගත් තීන්දුවක් බවත් ,එබැවින් ඔවුන්ටද කොමසාරිස්තුමාව හමු වීමට අවස්ථාවක් ලබාදෙන ලෙසටත් ඉල්ලූ බවත් සතියක කාලයක් ලබා දුන් බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ඝෝෂාව......

මෙය මහා සභාව මඟින් ගත් තීන්දුවක් බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

2020-06-16 වන දින ගමේ පිරිස එක් වී එම මාර්ගය අවශ්‍ය බවට අත්සන් කර ලිපියක් ලබා දුන් බවත්,ජනාධිපතිතුමාටද එය යවා ඇති බවත් ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.

එම මිනින්දෝරු මහතා වැරදියට මනින බව දිනක් ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන මහතාද පැවසූ බවත් ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ගෝඨාභය වික්‍රමසිංහ මහතා ප්‍රකාශ කරන ලදී.වෙනත් මිනින්දෝරු මහතෙකු ලවා මැනුම් කටයුතු කරමුයැයිද තවදුරටතත් ප්‍රකාශ කරන ලදී.ලේකම් මහතාට කොමසාරිස්තුමා විසින් එවා ඇති ලිපිය සභාගත කරන ලෙසද ඉල්ලා සිටින ලදී.

නිවැරදි මිනුමක් ගෙන මෙය අවසන් කරමුයැයි ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙහිදී රජය මඟින් මිනුම් කර එවා ඇති බව ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.

තමන්ව ඒ පිළිබඳව දැනුවත් කර නොමැති බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

පළාත් පාලන කොමසාරිස්තුමා විසින් ලේකම් මහතාව දැනුවත් කල බවට ලිපිය එවා ඇති බවත් ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.

✪ ගරු සභාපතිතුමාගේ හා ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහා සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත් කර ලේකම් මහතාට මේ පිළිබඳව සභාව දැනුවත් කිරීම සඳහා අවස්ථාව සලසා දෙන ලදී.

ලේකම් මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළු දෙනාගෙන්ම අවසර ගැනීමෙන් පසුව තමන්ව දැනුවත් කිරීමට ලිපිය එවූ බවත්,එහිදී ගෙන ඇති මිනුම් වැරදි බවට පවසා ඇති බවත් ,එය විමර්ශන නිලධාරීන් විසින් වාර්තා කර ඇති බවත් ප්‍රකාශ කරන ලදී.

විමර්ශන නිලධාරීන්ට එසේ වාර්තා කිරීමට නොහැකි බවත් ,එය වැරදි බවට නිවැරදිව තහවුරු කරගෙන වැඩ කටයුතු කරමුයැයිද ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

කටුකෙන්ද ප්‍රදේශයේ සිටින එදිරිසිංහ මහතාව තමන් යෝජනා කර බව ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ගෝඨාභය වික්‍රමසිංහ මහතා ප්‍රකාශ කරන ලදී.

එසේ නම් එලෙස මැනුම් කටයුතු සිදු කරමුයැයිද,වැඩ අධිකාරී මහතා සහ විමර්ශණ නිලධාරීන්වද ගෙන්වා මෙය සිදු කරමුයැයිද ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙහි ගෙවීම් කරනුයේ කවුරුන්දැයි ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා විමසා සිටින ලදී.

සභාව මඟින් සිදු කරන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

තීරණ අංක 20

දන්කොටුව කටුකෙන්ද ප්‍රදේශයේ සිටින එදිරිසිංහ මහතා මඟින් මෙම මැදි කැලේ ඉඩම මැනුම් කටයුතු සිදු කිරීම සුදුසු බවත්, වැඩ අධිකාරී මහතා සහ විමර්ශණ නිලධාරීන්වද ගෙන්වා මෙය සිදු කරමුයැයිද ගරු සභාපතිතුමා යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ගෝඨාභය වික්‍රමසිංහ මහතා ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා ගරු මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

ලුණුවිල අහස්දියවල මාර්ගය නම් කිරීම පිළිබඳව ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ගෝඨාභය වික්‍රමසිංහ මහතා විමසා සිටින ලදී.

එහිදී ගැටළුවක් තිබෙන බවත් එය සලකා බලන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

න්‍යාය පත්‍රය අනුව සියළු වැඩ කටයුතු අවසන් වූ හෙයින් සියලු දෙනාටම ස්තුතිය පළ කරමින්ද ලබන්නාවූ නත්තල සුභ නත්තලක් හා ලබන්නාවූ 2023 වර්ෂය වාසනාවන්ත නව වසරක් වේවායැයිද ප්‍රාර්ථනය කරමින් ගරු සභාපතිතුමා විසින් ප.ව 2.30 ට පමණ සභාවේ වැඩ කටයුතු අවසන් කරන ලදී.